2026.07.26 ඉරිදා | අටවැනි කාණ්ඩය | 01 වැනි කලාපය
දැන් ඉරිදා

# මව්රට

රු.100

උපුල් ජෝෂප් ප්‍රනාන්දුගේ
**ගුරුදූ විග්‍රහය**

## යුක්තියද? ශක්තියද?

P ≫ 04








දින 7ට වෙඩි 7යි

# පාතාලය ඇවිස්සෙයි

P ≫ 02

හැම තැනම වෙඩි පිට වෙඩි

## ගොවි සටනට සජබය අනුරාධපුරේ දින 2ක්

P ≫ 02

# සජිත් රටේම විපක්ෂය එකතු කරයි

## සටන මහ පාරට

අගවිනිසුරුගේ සහ උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම ගන්නා වයස වසර දෙකකින් දීර්ඝ කිරීමට ආණ්ඩුව ගනු ලබන උත්සාහයට එරෙහිව පාර්ලිමේන්තුව නියෝජනය කරන සහ පාර්ලිමේන්තුව නියෝජනය නොකරන විපක්ෂයේ සියලු පක්ෂ එකතු කිරීමට විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පසුගිය සතියේදී පියවර ගත්තේය.

P ≫ 02

## ප්ලාන්ටේෂන්වලට සල්ලි දාපු අය වහාම ගන්න

මහබැංකුව නීතිය ක්‍රියාත්මක කරන්නයි යන්නේ

P ≫ 02

ජනාධිපති පුත්තු ප්‍රබල නිලධාරීන් දේශපාලනඥයන්

# ෆයිල් තොගයක් අරන් පරීක්ෂණ කණ්ඩායමක් ඔස්ට්‍රේලියාවේ ලොකු වැඩකට ගිහින්

P ≫ 02

## ලංකාව ඇතුළේ චීන පාතාලයක්

මෙහෙයුමක් කරන්න සූදානමක්

වීසා කාලය ඉකුත් වීමෙන් අනතුරුවත් නීති විරෝධීව ලංකාවේ රැඳී සිටින විදේශිකයන් සම්බන්ධයෙන් වහාම විමර්ශන ආරම්භ කිරීමට පොලිසිය කටයුතු කොට ඇති බව වාර්තා වේ.

P ≫ 02

# විනිසුරු කාලය දීර්ඝ කිරීම අනිවාර්යයෙන් කරනවා



ආණ්ඩුව අවසන් තීන්දුව අරන්

P ≫ 02



## අබිරහස් දිවි නසාගැනීම්

P ≫ 08



## ඉන්දියාව හොල්ලන කැරපොත්තන්ගෙන් ලංකාවෙත් පක්ෂයක්

P ≫ 02





AA-(lka) Fitch ශ්‍රේණිගත කිරීම. සන්නාම ශ්‍රේණිගත කිරීම: AAA- (Brand Finance Lanka)
ලංකා බැංකුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවකි.
යෝජනා/අදහස්/පැමිණිලි සඳහා - https://www.boc.lk/contact

**ලංකා බැංකුව හඳුන්වාදෙන 'Prosperity' ස්ථාවර තැන්පතු ගිණුම**

| වසර 2 තැන්පතු සඳහා | වසර 3 තැන්පතු සඳහා | වසර 5 තැන්පතු සඳහා | වසර 7 තැන්පතු සඳහා |
|---|---|---|---|
| 10.50% (වා.පො.) | 11.00% (වා.පො.) | 12.00% (වා.පො.) | 12.50% (වා.පො.) |
| (වා.ස.පො.අ. 10%) | (වා.ස.පො.අ. 9.97%) | (වා.ස.පො.අ. 9.86%) | (වා.ස.පො.අ. 9.40%) |
| පොලී ගෙවීම කල්පිරීමේ දී | පොලී ගෙවීම කල්පිරීමේ දී | පොලී ගෙවීම කල්පිරීමේ දී | පොලී ගෙවීම කල්පිරීමේ දී |
| රුපියල් 250,000/- සිට ඇරඹිය හැකිය | රුපියල් 250,000/- සිට ඇරඹිය හැකිය | රුපියල් 250,000/- සිට ඇරඹිය හැකිය | රුපියල් 1,000,000/- සිට ඇරඹිය හැකිය |

- ආකර්ෂණීය පොලී අනුපාත
- අවශ්‍යතාවය මත තෝරාගත හැකි විවිධ කාල සීමා
- විවිධ පොලී ගෙවීම් ක්‍රම
- තැන්පතුව මත ණය පහසුකම්
- ස්වයංක්‍රීය අලුත් කිරීම

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය බැංකුවෙන් පිරිනැමෙන වඩාත්ම ආකර්ෂණීය සහ විශ්වාසවන්ත තැන්පතු ගිණුම සමගින් ඔබේ අනාගතය සුරක්ෂිත කරගන්න.

වැඩි විස්තර සඳහා ළඟම ලංකා බැංකු ශාඛාවට පිවිසෙන්න නැතහොත් 1975 අමතන්න.

ප්‍රධාන කාර්යාලය, BOC චතුරස්‍රය, අංක 1, ලංකා බැංකු මාවත, කොළඹ 1.

ලංකා බැංකුව
BOC
ජාතියේ මහා පහන් ටැඹ



## දිනේෂ්ගේ සජීවී දිවි නසාගැනීමයි
## ඉංග්‍රීසි ගුරුවරියගේ නිරූපණ තරගයයි

# ෆේස්බුක් බලලා තීන්දු ගන්න හදිසි වෙන්න එපා

**සමාජ මාධ්‍ය යනු තොරතුරු හුවමාරු වන වේගවත්ම තැනක්. නමුත් එය ඇතැම් විට සත්‍යය යටපත් කරමින් අසත්‍යයට පියාපත් ලබාදෙන තැනක්ද වේ. පසුගිය දිනක කරන්දෙණිය මඩකුඹුර ප්‍රදේශයේ තරුණයෙකුගේ සියදිවි හානිකර ගැනීමත්, ඒ පිළිබඳ සමාජ මාධ්‍ය තුළ පැතිර ගිය විවිධ කතාන්දරත් ඊට හොඳ උදාහරණයකි.**

**තම අවසන් මොහොත සජීවී වීඩියෝවක් ලෙස විකාශය කරමින් ජීවිතයට සමුදුන් දිනේෂ්ගේ මරණය රටම කම්පනයට පත්කළ සිදුවීමක් විය. එහෙත් ඒ කම්පනයටත් වඩා වේදනාකාරී වූයේ සත්‍යය නොදැන ඔහුගේ මවටත්, පවුලේ අයටත් එල්ල වූ අභූත චෝදනාය. 'ඉඩම ලොකු පුතාට ලියා දුන්නා', 'කෝටි ගණනක ණය තිබුණා' වැනි කිසිදු සාක්ෂියක් නොමැති කතා සමාජ මාධ්‍ය ඔස්සේ වේගයෙන් පැතිර ගියා. ඒ වචනවලින් දරුවා අහිමි වූ මවකගේ හදවත තවත් වරක් කැඩී බිඳී ගියා.**

මේ අතර තවත් සිදුවීමක්ද සමාජ මාධ්‍යයේ දැඩි ආන්දෝලනයකට ලක්විය. ජාත්‍යන්තර රූ රැජින තරගයකට බිකිනියකින් සැරසී පසුගියදා ඉදිරිපත් වූ කාන්තාව ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ පාසලක ගුරුවරියක් බවටත්, ඒ හේතුවෙන් ඇයට විනය ක්‍රියාමාර්ග ගන්නා බවටත් සමාජ මාධ්‍යයේ පළවිය. පසුව අනාවරණ වූයේ එම ඡායාරූපයේ සිටියේ ශ්‍රී ලාංකික ගුරුවරියක් නොව, ගෝතමාලාවේ නිරූපිකාවක් වන ජෙමී ස්ටෙෆනි බවයි.

මෙම සිදුවීම් දෙකම අපට කියා දෙන්නේ එකම පාඩමකි. ඒ, සමාජ මාධ්‍යයේ පළවන සෑම දෙයක්ම සත්‍ය නොවන බවයි. සත්‍යය සොයාබැලීමට පෙර තීන්දු දීමෙන් අහිංසක මිනිසුන්ට ජීවිත කාලය පුරාම මකාදැමිය නොහැකි වේදනාවක් ඉතිරි කළ හැකිය.

දිනේෂ්ගේ අවසන් මොහොතේ ඔහුගේ අම්මා පැමිණ දිනේෂ්ගේ සිරුර බදාගෙන වැළපෙනවා. ඒ වැළපීම කාගේත් හදවත් රිදුමකට ලක්කළා. දිනේෂ්ගේ මිතුරන් මේ සජීවී වීඩියෝව දැක අලුයම 12.30ට පමණ එම නිවසට පැමිණ දිනේෂ්ගේ ජංගම දුරකතනය හරහා සජීවීව ප්‍රචාරය වෙමින් තිබූ වීඩියෝව නතර කර දැමුවා. ඒ වනවිට සියල්ල සිදුවී හමාරව තිබුණා. එම සිදුවීමෙන් බොහෝ දෙනෙක් කම්පනයට පත්ව තිබුණා.

පසුව දිනේෂ්ගේ මව මාධ්‍ය හමුවේ කඳුළු සලමින් කියූ වචන සෑම මවකගේම හදවතෙන් නැගෙන හඬක් විය. ඇය පැවසුවේ තම පුතා අහිංසක, අවංක දරුවෙකු බවත්, ඔහු තම දරුවන් තිදෙනාගෙන් වැඩිමහල් පුතා බවත්ය. ඔහුගේ ජීවිතය තුළ රැකියා, විදේශ ගමන්, විවාහ ජීවිතය සහ පෞද්ගලික අභියෝග රැසක් තිබූ බවත්, ඒවා නිසා ඔහු මානසිකව බිඳවැටී සිටි බවත් ඇය පැහැදිලි කළාය. තමන් කුරුඳු තළා හෝ මුදල් සොයා දී ඔහුගේ අනාගතය ගොඩනගන්නට සූදානමින් සිටි බවත්, තම දරුවන් තිදෙනාටම එක ලෙස ආදරය දැක්වූ බවත් ඇය කියා සිටියාය.

ඇයගේ ප්‍රකාශ සත්‍යයද අසත්‍යයද යන්න තීරණය කිරීම අධිකරණයට හා විමර්ශන අංශවලට අයත් කාර්යයකි. එහෙත් තහවුරු නොකළ චෝදනා සමාජ මාධ්‍යයේ පැතිරවීමෙන් පවුලකට සිදුවන හානිය නම් අප සැමට පැහැදිලිව දැකගත හැකිය.

මෙවැනි සිදුවීම්වල තවත් වැදගත් කරුණක් තිබේ. සියදිවි හානි සම්බන්ධයෙන් අනුමාන, චෝදනා හෝ සංවේදී වීඩියෝ බෙදාහැරීම තවත් පවුල්වලටත් අහිතකර විය හැකිය. දුකක් ඇති පවුලකට සහනයක් වෙනුවට තවත් වේදනාවක් එක් කිරීම කිසිසේත්ම මානුෂීය ක්‍රියාවක් නොවේ.

කවමදාවත් අම්මලා දරුවන්ගේ අයහපත වෙනුවෙන් වැඩ කරන්නේ නැහැ. නමුත් බොහෝ අය කිව්වේ එහෙම කතාවක් නොවෙයි. ඒ අම්මා ඉන්නේ තවමත් හැඬූ කඳුළෙන් සහ හදවතේ දැවෙන වේදනාවෙන්. මුහුණු පොතේ විවිධ පුද්ගලයන් මේ සම්බන්ධව විවිධ චෝදනා එල්ල කර තබුණු අතර, මේ සිදුවීම බොහෝ ආන්දෝලනයකට පත්වුණා. ඔවුන් චෝදනා කළේ දිනේෂ්ගේ පවුලේ අයටයි. නමුත් ඒ කතාව සත්‍යයක් නොවෙයි. දිනේෂ් සිය ජීවිතයේ අත්වැල අල්ලගෙන යන්න තෝරගත්තේ නොගැළපෙන තරුණියක් බව ඔහුගේ මව යූටියුබ් සම්මුඛ සාකච්ඡාවකට එක්වෙමින් පවසා සිටියා. එහිදී ඒ අම්මා හදවතේ කැකෑරෙන වේදනාව පිටකළේ මෙලෙසයි.

'ඒ ඔක්කොම පට්ටපල් බොරු මගේ පපුව පැලෙන්න එනවා. මම අද රටටම ඇත්ත කියනවා. මගේ පුතා කියන්නේ අහිංසක චරිතයක්. හරි අවංකයි. හරිම හොඳයි. හැම කෙනාටම එක හා සමානයි. මට දරුවෝ තුන්දෙනෙක් ඉන්නවා. දිනේෂ් කියන්නේ වැඩිමහල් දරුවා. මට වෙන ලොකු පුතාලා නැහැ. ඉන්නේ දුවෙක් සහ පොඩි පුතෙක් විතරයි. දිනේෂ් පහේ පන්තිය වෙනකල් මඩකුඹුරේ ඉස්කෝලේට ගියා. පස්සේ කරන්දෙණිය ඉස්කෝලෙට ගියා. උසස් පෙළට මාස 3ක් තියෙද්දි ආමි එකට යන්න ඕනේ කිව්වා ළමයි තුන්දෙනෙක් ගියා කියලා. ආමි එකට ගිහිල්ලා රැකියාව කළා ටික කාලයක්. ඊට පස්සේ ගාමන්ට් යන්න ඕනේ කිව්වා. පස්සේ ලෝන් දෙන කොම්පැනියක වැඩකළා. ඊට පස්සේ රට යන්න ඕනේ කියලා කොරියන් විභාගය කරලා පාස්වුණා. මේ 28 වැනිදාට ගිහිල්ලා අවුරුද්දයි. අවුරුද්දක් ඉඳලා ආවා. ආපහු සති දෙකක් ඉඳලා කොරියාවට ගියා. මිනෝලි කියලා හිඟුරක්ගොඩ පදිංචි කෙනෙක් සමග තමයි පුතා විවාහ වුණේ. පුතා කිව්වා එයා අසරණ වෙලා ඉන්නේ, එයාට පිහිට වෙන්න ඕනේ කියලා. කලින් විවාහ වෙච්ච කෙනා මැරිලා දරුවෙක් ඉන්න කෙනෙක්. අපි ඒ බව දන්නෙත් විවාහ වෙලා කල් ගියාට පස්සේ. මිනෝලිව කොරියාවට ගත්තේ අපේ පුතා. අවුරුදු එකහමාරක් විතර ඇති.

කවදාවත් ඒ දෙන්නා සතුටෙන් හිටියේ නැහැ. අම්මේ මට ගැළපෙන්නේ නැහැ කියලත් කිව්වා විවාහ වුණාට පස්සේ.



නිලන්ති රේණුකා

දිනේෂ්ගේ තාත්තාත් මීට අවුරුදු දෙකකට කලින් මියගියා. පුතා කොරියාවේ හිරෙත් හිටියා. මිනෝලි නම් කිව්වේ පුතා හිරේ ගියේ කොම්පැනියේ කෝටි දෙකහමාරක් විතර හොරකම් කරලා ඉඩම් විකුණලා ඒක ගෙවන්න කියලා.

දිනේෂ් කිව්වා සිර දඬුවම් විඳින්න සිද්ධ වුණෙත් මිනෝලි හින්දා කියලා. දිනේෂ් අවුරුද්දක් සිර දඬුවම් විඳලා ලංකාවට ආවාම කිව්වේ මගේ මුළු ජීවිතේම මිනෝලි නිසා නැතිවුණා කියලායි. කට්ට කපටි ගෑනියෙක් අම්මත් කතා කරන්න එපා කියලා මට කිව්වා. මම ලස්සනට හිටියා මෙයා ගෙනිච්චාත් හරි මගේ මුළු ජීවිතේම විනාශ වුණා කියලා දිනේෂ් මානසිකව වැටිලා හිටියේ. දිනේෂ්ව කොරියාවෙන් පිටුවහල් කළා මිනෝලි නිසා.'

'ඊට පස්සේ දිනේෂ් කිව්වා අම්මේ මට ජපන් යන්න ඕනේ කියලා. ඒත් ජපන් යන්න කෝස් කරන්න සල්ලි ඕනේ, සල්ලි නැති නිසා කුරුඳු තළලා මම සල්ලි හොයලා දෙන්න හිටියේ. මුහුණු පොතේ තිබුණා වැඩිමහල් සහෝදරයෙකුට ගේ ලිව්ව නිසා දිනේෂ් දිවි නසාගත්තා කියලා. ඒක සම්පූර්ණ බොරුවක්. ඒකත් මිනෝලි හදපු කතාවක්.

මේ ගෙදර ඔප්පුවක්වත් මම දැකලා නැහැ. මේකේ අයිතිකාරයෝ ලොකු තාත්තාලා. බාල සහෝදරයෝ වුණත් අයියා මේවා දුන්නොත් විතරක් ගනී. මම වුණත් එහෙම කරන්න දෙන්නේ නැහැ. එයා දුක් මහන්සියෙන් හම්බකරගත්ත සල්ලි එයාට දෙනවා මිසක් මම වෙන අයට දෙන්නේ නැහැ. මට මගේ දරුවෝ තුන්දෙනා පණ වගේ. මිනෝලි රට ඉන්නකල් විතරයි චාටු කතාබස් කළේ. ආවාට පස්සේ වෙස් පෙරළුණා වගේ වුණා. මගේ පුතාට ඕනෙ වුණේ මටයි සහෝදර සහෝදරියන්ටයි සැප දෙන්න. මං යතුරු කැරලි පහම මිනෝලිට දුන්නා. සමහර දවසට ගෙදරින් එළියට අපි ගියොත් පැය ගානක් එළියේ ඉන්නවා ගෙදරට යන්න බැරිව. මම අද වෙනකල් වචනයක් කියලා නැහැ එයාට. මගේ අහිංසක දරුවගේ මනස අවුල් වුණා. පුදුම ලස්සනට තිබුණු පවුලක් අපේ පවුල. අන්තිම දවස වුණේ ජූලි 12 වැනිදා උදේ දිනේෂ්ගේ කොරියාවේ හිටිය හොඳම යාළුවා තමයි දිනේෂ්ගේ බිරිඳ සමග සම්බන්ධකමක් පවත්වන්නේ. මම දැන් මැරි මැරී ජීවත් වෙන්නෙ...'

දිනේෂ්ගේ හොඳම මිතුරා වූ ඉන්දික ප්‍රභාත් අවසන් මොහොතේ පැමිණ මේ සජීවී වීඩියෝව විසන්ධි කර තිබුණා. ඔහු ඒ මොහොත විස්තර කළේ මෙලෙසයි.

'දිනේෂ් මියගිය 12 වැනිදා උදේ ඉඳලා අපිත් එක්ක තමයි හිටියේ. එදා මැච් එකක් තිබුණා. මැච් එක ඉවර වෙලා බියර් එකක් බීලා රෑ මළගෙදරක යන්න සෙට් වුණා. ඒත් දිනේෂ් මළ ගෙදර ගියේ නැහැ. ලයිව් එක දැක්ක ගමන් යාළුවන්ට කතා කරලා දිනේෂ්ගේ ගෙදර එනකොට වෙන්න ඕනෙ දේ සිදුවෙලා හමාරයි. ජංගම දුරකතනයේ පාස්වර්ඩ් එක විදියට එයාගේ උපන් දිනේ දාලා තිබ්බෙ. එදා පාස්වර්ඩ් එක වෙනස් කරලා තිබ්බා. ගෙදර බිත්තියේ ඒක ලියලා තිබ්බා. දිනේෂ් චුට්ටක් මිස් වෙච්ච ගමන් කේන්ති යනවා. මැයි 30 වැනිදාත් මේ විදියටම සිදුකරගන්න හදලා බිරිඳට යවලා තිබුණා. නමුත් එදා කොහොම හරි බේරුණා...'

අම්මා කිව්වේ මම කුරුඳු තළලා කොහොම හරි සල්ලි හොයලා දෙන්නම් ජපන් යන්න කියලා. ඒ තමයි අම්මලාගේ හැටි. කොයි තරම් පිට ගෑනු අකටයුතුකම් කළත් අම්මලා තමන්ගේ දරුවන් වෙනුවෙන් ඕනෑම දුකක් දරනවා, දුකක් විඳිනවා.

සමාජ මාධ්‍ය අපට තොරතුරු ඉක්මනින් ලබාදෙනවා සේම සත්‍ය තහවුරු නොකර පැතිරෙන අසත්‍ය නිසා ජීවිතවලට ගැඹුරු හානියක්ද සිදුකළ හැකියි. දිනේෂ්ගේ මරණය වටා පැතිර ගිය චෝදනා, තහවුරු නොකළ තොරතුරු ඒ පවුලේ අයට කොයි තරම් වේදනාකාරී වන්නට ඇද්ද? අපි යමක් සමාජ මාධ්‍යයේ බෙදාගන්නට පෙර ඒ ගැන දහස් වරක් සිතිය යුතුයි. එක් පෝස්ටුවක්, එක් කතාවක්, එක් වීඩියෝවක් නිසා කෙනෙකුගේ ජීවිතයේ මානසික සැනසීම සම්පූර්ණයෙන්ම බිඳවැටෙන්නට පුළුවන්. ඒ නිසා සමාජ මාධ්‍යයේ සංවේදී බව වගකීම සහ මනුෂ්‍යත්වය අමතක නොකළ යුතුයි.

කෙනකුගේ ජීවිතයක් ගැන පූර්ව නිගමනවලට පැමිණ ඒ පිළිබඳ ලියන්නට පෙර මොහොතක් සිතමු. තොරතුරු බෙදාහරින්නට පෙර සත්‍යය සොයමු. මන්ද එක් අසත්‍ය පණිවුඩයක් නිසා දැනටමත් බිඳුණු හදවතක් තවත් දහස් වරක් බිඳදැමිය හැකි නිසාවෙනි.

---

### සජිත් රටේම...

ඒ අනුව, පසුගිය බ්‍රහස්පතින්දා (23) විපක්ෂ නායක කාර්යාලයේ සජිත් ප්‍රේමදාස මහතාගේ ආරාධනයෙන් පැවැති රැස්වීමට විපක්ෂයේ සියලු පක්ෂ නායකයන් සහභාගී වී සිටීම විශේෂ සිදුවීමක් විය.

ඒ අනුව එම රැස්වීමට එජාප නායක රනිල් වික්‍රමසිංහ, දිනේෂ් ගුණවර්ධන, රවුෆ් හකීම්, නාමල් රාජපක්ෂ, රවී කරුණානායක, ගජේන්ද්‍ර පොන්නම්බලම්, මනෝ ගනේෂන්, ජී.එල්. පීරිස්, පලනි දිගම්බරම්, ආරුමුගම් තොණ්ඩමන්, පාඨලී චම්පික රණවක, අසංක නවරත්න, චාමර සම්පත් දසනායක, නිමල් සිරිපාල ද සිල්වා, දිලිත් ජයවීර, විමල් වීරවංශ, උදය ගම්මන්පිල, මහින්ද අමරවීර, ටිරාන් අලස්, ජනාධිපති නීතිඥ මෛත්‍රී ගුණරත්න ඇතුළු විශාල පිරිසක් එක්ව සිටියහ.

එහිදී පැවැති සාකච්ඡාවේදී මෙතෙක් පාර්ලිමේන්තුව තුළ ගෙනගිය සටනක් ඉදිරියේදී මහ පාරට රැගෙන ඒමට කටයුතු කළ යුතු බව විපක්ෂයේ සියලු පක්ෂ නායකයන් අවධාරණය කර තිබූ බවක් දැනගන්නට තිබේ.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු 'රාජ්‍ය රහස්' තීරයේ පළවේ.

### පාතාලය ඇවිස්සෙයි...

ගෙවුණු දින 7 ඇතුළත රට පුරා වෙඩිතැබීමේ සිදුවීම් 7ක් සිදුව ඇති බව පොලිස් ආරංචි මාර්ග අනාවරණ කරයි.

ඒ අනුව පසුගිය 16 වැනිදා නවගමුව වඳුරමුල්ල ප්‍රදේශයේදී වෙඩිතැබීමක් සිදුවූ අතර, ඉන් 26 හැවිරිදි තරුණයකු මියගොස් තිබිණි.

ඉන් අනතුරුව පසුගිය 19 වැනි දින ගල්කිස්ස පොදු සුසාන භූමියෙහි මුරකරු වශයෙන් කටයුතු කළ පාතාල අපරාධකරුවකු වන සැන්ඩෝ නමැත්තාගේ පියාට වෙඩිතැබීමට කිසියම් පිරිසක් කටයුතු කොට තිබිණි. එම වෙඩි ප්‍රහාරයන් ඔහු තුවාල ලබා රෝහල්ගත කිරීමට පියවර ගෙන තිබිණි.

පසුව 21 වැනිදා ගල්කිස්ස ටෙම්ප්ලර්ස් පාරේදී යතුරුපැදියකින් පැමිණි දෙදෙනකු පුද්ගලයකු ඉලක්ක කරගෙන වෙඩි තැබීමට උත්සාහ කර තිබූ නමුත්, ගිනිඅවිය ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම උත්සාහය ව්‍යර්ථ වී තිබිණි.

මීට අමතරව පසුගිය 22 වැනි දින පෙරවරුවේ දෙවුන්දර දේවාලය ආසන්නයේ පිහිටා තිබූ නිවසකට වෙඩි ප්‍රහාරයක් එල්ල කොට තිබුණද, ඉන් කිසිවකුට තුවාල සිදුව තිබුණේ නැත.

අවසාන වශයෙන් පසුගිය බ්‍රහස්පතින්දා (23) පෙරවරුවේ බෙලිඅත්ත වලවල ප්‍රදේශයේ පිහිටි පොලිස් නිලධාරියකුගේ නිවසට වෙඩිතබා තිබූ අතර, දහවල් කාලයේදී දෙමටගොඩ කුප්පියාවත්ත සුසානභූමිය ආසන්නයේදීද වෙඩිතැබීමක් සිදුව තිබිණි. ඉන් යතුරුපැදියකින් ගමන් කරමින් සිටි පුද්ගලයකු තුවාල ලබා තිබිණි.

එදිනම සවස වත්තල පොලිස් වසමට අයත් පල්ලියවත්ත කදිරාන පාලම ආසන්නයේදී උත්සව ශාලාවකට එල්ල කළ වෙඩි ප්‍රහාරයෙන් එක් පුද්ගලයකු මියගොස් තිබිණි.

පොලිසිය පවසන්නේ මේ සෑම සිද්ධියක් පසුපසම පාතාල ක්‍රියාකාරිකයන් සිටින බවත්, ඒ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදුකෙරෙමින් පවතින බවත්ය.

### ෆයිල් තොගයක්...

දැනට විමර්ශනය කෙරෙමින් පවතින ආන්දෝලනාත්මක සිදුවීම් කිහිපයක් සම්බන්ධයෙන් අතිශය වැදගත් තොරතුරු රැසක් අනාවරණ කරගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ නිලධාරීන් කිහිප දෙනකුගෙන් සමන්විත කණ්ඩායමක් ඕස්ට්‍රේලියාව බලා පිටත්ව ගොස් ඇති බව වාර්තා වේ.

හිටපු ප්‍රබල දේශපාලනඥයන්, ප්‍රබල නිලධාරීන් සහ හිටපු ප්‍රබල ජනාධිපතිවරයකුගේ පුත්‍රයකු සම්බන්ධයෙන් සිදුකෙරෙන විමර්ශන රැසකට අදාළව තොරතුරු ලබාගැනීම සඳහා මෙම නිලධාරීන් ඕස්ට්‍රේලියාව බලා පිටත්ව ගොස් ඇති බව දැනගන්නට තිබේ.

ඒ අනුව ශ්‍රී ලන්කන් ගුවන් සමාගමට 2013 වසරේදී යානා දහයකින් සමන්විත ගුවන් බළඇණියක් මිලදී ගැනීමේදී යුරෝපීය ගුවන් සමාගමකින් ඇමෙරිකන් ඩොලර් මිලියන 2ක අල්ලස් මුදලක් ලබාගත් බවට ශ්‍රී ලංකන් ගුවන් සේවයේ හිටපු විධායක නිලධාරී කපිල චන්ද්‍රසේන මහතාගේ බිරිය වන ප්‍රියන්කා නියෝමාලි විජේනායක හා තෙවැනි සැකකාර ෂමීන්ද්‍ර රාජපක්ෂ යන අය සම්බන්ධයෙන් ජාත්‍යන්තර පොලිසිය හරහා ඉදිරි පියවර ගැනීම මෙම සංචාරයේ එක් අරමුණක් වී තිබේ.

මෙම අල්ලස් මුදල් ප්‍රේෂණය වූයේ යැයි කියන බැංකු ගිණුමක හිමිකරුවකු බව කියන ඩබ්ලිව්.ඩී. නිමල් පෙරේරා යන අය ඕස්ට්‍රේලියාවේ පදිංචි වී සිටින අතර, ඔහුගෙන් ප්‍රකාශ ගැනීමට නියමිත බවද දැනගන්නට ඇත.

එසේම හිටිහැටියේම කෝටිපතියන් බවට පත්ව සිටින රාජ්‍ය නිලධාරීන් රැසක් සම්බන්ධයෙන් පවත්වන විමර්ශනවලට අදාළව ඕස්ට්‍රේලියාවේ පවතින දේපළ සහ ගිණුම් සම්බන්ධයෙන් විමර්ශන සිදුකිරීමද මෙම සංචාරයේදී සිදුකිරීමට නියමිත බව වාර්තා වේ.

එමෙන්ම හිටපු ප්‍රබල ජනාධිපතිවරයකුගේ පුත්‍රයකු විසින් මිලදී ගෙන ඇතැයි කියන ඉඩමක් සම්බන්ධ ලිපිගොනුවක්ද මෙම නිලධාරීන් ඕස්ට්‍රේලියාවට ගෙනගොස් ඇති බව දැනගන්නට ඇත.

### විනිසුරු කාලය...

අගවිනිසුරුගේ සහ උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම කාලය තවත් වසර දෙකකින් දීර්ඝ කිරීමට අදාළ යෝජනාව කඩිනමින් ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව තීරණය කොට ඇති බව වාර්තා වේ.

ඒ අනුව ඊට අදාළ සංකල්ප පත්‍රිකාව අවසන් වරට පැවැත්වූ කැබිනට් මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට ජනාධිපතිවරයා කටයුතු කොට තිබූ බවක් දැනගන්නට තිබේ.

විපක්ෂය මේ සම්බන්ධයෙන් කුමන ප්‍රතිචාරයක් දැක්වුවද ආණ්ඩුව කලින් තීන්දු කර තිබූ ආකාරයටම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙනැවිත් එය සම්මත කරගැනීමට ආණ්ඩුව තීරණය කොට ඇති බවක්ද දැනගන්නට ඇත.

### ප්ලාන්ටේෂන්වලට...

ප්ලාන්ටේෂන් නමින් දැන්වීම් පළකරමින් මහාපරිමාණයෙන් නීති විරෝධීව මුදල් එකතු කර ඇති සමාගම්වලට එරෙහිව දැඩිව නීතිය ක්‍රියාත්මක කිරීමට තීරණය කොට ඇති බැවින් එවැනි සමාගම්වල මුදල් ආයෝජනය කොට ඇත්නම් වහාම එම මුදල් නැවත ලබාගැනීමට කටයුතු කරන ලෙස මහබැංකු අධිපති නන්දලාල් වීරසිංහ මහතා ජනතාවගෙන් ඉල්ලීමක් කොට තිබේ.

පසුගියදා මහබැංකු පරිශ්‍රයේදී විශේෂ මාධ්‍ය හමුවකට එක්වෙමින් මහබැංකු අධිපතිවරයා මේ බව දැනුම් දී සිටියේය.

මේ වනවිටත් පැමිණිලි ලැබී ඇති එවැනි සමාගම් කිහිපයක් සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කොට ඇති බව කී මහබැංකු අධිපතිවරයා, අදාළ මුදල් ඉල්ලීමෙන් පසු ඒවා ලබා නොදීමට කටයුතු කරන සමාගම් ඇත්නම් ඒ සම්බන්ධයෙන් වහාම මහබැංකුව දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙසද ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

### චීන පාතාලයක්...

පසුගියදා පෝර්ට් සිටි පරිශ්‍රයේ රැඳී සිටියදී චීන ජාතිකයන් පිරිසක් විසින් පැහැරගෙන යෑමෙන් අනතුරුව මියගිය චීන ජාතිකයකුගේ සිරුරක් හමුවීමත් සමග බලධාරීන් විසින් මෙම තීන්දුව ගෙන ඇති බව දැනගන්නට තිබේ.

මෙම පැහැරගැනීම සිදුකළ පුද්ගලයන් එදිනම නැවත කටුනායකින් සිංගප්පූරුව බලා පිටත්ව යෑමට සූදානමින් සිටියදී අත්අඩංගුවට ගැනීමට ආරක්ෂක අංශ කටයුතු කොට තිබිණි.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවට පැමිණ සිටින විදේශිකයන් රාශියක් සිය වීසා කාලය ඉක්ම යෑමෙන් අනතුරුව නීති විරෝධී ලෙස ශ්‍රී ලංකාව තුළ වෙනත් රැකියාවල නිරත වෙමින් සිටින බවට පැමිණිලි විශාල ප්‍රමාණයක් පසුගිය කාලය පුරාම පොලිසිය වෙත ලැබී තිබිණි.

### ඉන්දියාව හොල්ලන...

ඉන්දීය රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තියට එරෙහිව දැවැන්ත විරෝධතා ව්‍යාපාරයක් ආරම්භ කොට ඇති 'කැරපොතු පක්ෂයේ' ශාඛාවක් ලංකාව තුළද ආරම්භ කිරීමට යෝජනා වී ඇති බවක් වාර්තා වේ.

ඒ අනුව, මේ සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡා වට ගණනාවක් එම පක්ෂයේ නියෝජිතයන් අතර පැවැත්වී ඇති බව දැනගන්නට තිබේ.

ඒ සඳහා දැනටමත් ශ්‍රී ලංකාවෙන් නියෝජිතයන් කිහිප දෙනකු හඳුනාගෙන ඇති බවත්, ඉදිරියේදී ඔවුන් සමග කැරපොතු පක්ෂයේ ප්‍රධානීන් සාකච්ඡා ආරම්භ කිරීමට සැලසුම් කොට ඇති බවත් දැනගන්නට ඇත.

එමෙන්ම ඉදිරියේදී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා කැරපොතු පක්ෂයේ ප්‍රබලයන් කිහිප දෙනකු ලංකාවේ සංචාරය කිරීමට සූදානමින් සිටින බවක්ද වාර්තා වේ.

### ගොවි සටනට...

වීවලට සාධාරණ මිලක් ලබාදෙන ලෙස ඉල්ලා ගොවීන් විසින් ආරම්භ කොට ඇති සටනට සහාය පළකිරීමට සමගි ජන බලවේගය තීරණය කොට ඇත.

ඒ අනුව, ලබන මාසය ආරම්භයේදී සජබ නායකයන් අනුරාධපුර ප්‍රදේශයේ දින 2ක සංචාරයක නිරත වීමට සැලසුම් කොට ඇති බවක් දැනගන්නට තිබේ.

මෙම සංචාරයේදී ප්‍රදේශයේ ගොවීන් හමුවී ඔවුන්ට ඇති ප්‍රශ්න සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමටත්, අනුරාධපුර ප්‍රදේශය කේන්ද්‍ර කොට ගෙන දැවැන්ත විරෝධතා ව්‍යාපාරයක් පැවැත්වීමටත් සජබය තීරණය කොට ඇති බවක්ද වාර්තා වේ.

---

#### න්දා ශ්‍රීගේ කැබිනෙට්ටුව

### වෛරය වපුර වපුරා රට නසනු එපා

මීගමු සිපිරි ගෙය ඇතුළත සිදුවීම
කළ හැකි නොවේ සුළු කොට ඉවතට දැම
ගැනෙනා බවක් කීවද එහි වගකීම
සිදුවන බවක් නම් නැත තව වගවීම

සිටියදී විරුදු පස මේ වගෙ දෙයක් වෙලා
අදට ද කොළඹ මංමාවත් හරස් වෙලා
එම ළඳ බොළඳ වැඩ එකිනෙක පසක් වෙලා
ඉතිහාසය පෙරදී තිබු අද වෙනස් වෙලා

බාධක එවැනි නැත අද පාලකයන්ට
අපමණ නිදහසකි බල නායකයන්ට
මේවා එපා යළි සුළු කොට සලකන්ට
පැන විසඳුමට සැම දෙන එකමුතු වෙන්ට

වෛරය වපුර වපුරා රට නසනු එපා
මැදහත් හැඟුම් ඇති සිත් ගිනි තබනු එපා
රට ගොඩනැගුම සුළු දෙයකැයි සිතනු එපා
මතුකර ගනිමු රට ගොඩ අර ගැනුමෙ උපා

පවතී කළ යුතුව සැම වැඩෙක කළමනා
ඒකය රටට අද දවසෙහිද උවමනා
ජන්දෙට පෙරදී මෙන් එකී නෙකට බැණ බැණා
සිටිනා පිරිස් නැහැ අප රටට වුවමනා

සිය ගණනක් සිටිය යුතු සිපිරි ගෙය තුළ
තැබුවිට දහස් ගණනක් අනිසි ප්‍රතිඵල
ඇතිවන බවක්, නොදැනෙන ඉහළ මොළවල
ඇත්තේ කිමද විමසනු නොකර කලබල

මව්රට

ලිපිනය
නො: 22, ජයරත්න මාවත,
කොළඹ 05

කර්තෘ මණ්ඩලය
0112505134

ඊමේල්
news@mawratanews.lk

වෙබ් අඩවිය
www.mawratanews.lk

බෙදාහැරීම්
0764 449 688

දැන්වීම්
0114870063

උපුල් ජෝශප් ප්‍රනාන්දුගේ

# ගුරුදූ විග්‍රහය




## යසපාලිත නිර්මාණයක් රස සාගරයක්

# යුක්තියද? - ශක්තියද?

**'යසපාලිත නිර්මාණයක්... රස සාගරයක්...' මේ, අධිකරණ ඇමැති හර්ෂණ නානායක්කාරගේ පියා යසපාලිත නානායක්කාර අධ්‍යක්ෂණය කරන චිත්‍රපටවලට දමන ස්ලෝගන් එක නොහොත් ප්‍රචාරක තේමාවය.**

'යසපාලිත කියන්නේ කවුද?'

යසපාලිතලා පැවැත එන්නේ ගාල්ලේ ධනවත් වැවිලිකරුවන්ගේ පවුලකිනි. යසපාලිතගේ පියා ෆ්‍රැන්සිස් නානායක්කාර ධනවත් ව්‍යාපාරිකයෙකි. ඔහු තොග වෙළෙඳාම, ප්‍රවාහන සහ වැවිලි සමාගම් හිමි ධනවතෙකි. ඔහුට පුතුන් හතර දෙනෙක් විය.

එක් අයෙක් යසපාලිත නානායක්කාරය. අනෙකා හේමකුමාර නානායක්කාරය. අනෙකා වාසුදේව නානායක්කාරය. ෆ්‍රැන්සිස් නානායක්කාරලා උපන් ගෙයි යූ.ඇන්.පී.කාරයන්ය. ඒ කාලේ වැවිලිකරුවන්, ප්‍රවාහන සාමගම් හිමිකරුවන් සියල්ලන් පාහේ යූ.ඇන්.පී.කාරයන් විය. ධනපති වැවිලිකරුවන්ගේ පුත්තු වාමවාදී වීම ඒ කාලේ ෆැෂන් එකකි. තාත්තා කැපුවත් කොළ යූ.ඇන්.පී. වුණාට යසපාලිත, හේමකුමාර සහ වාසුදේව තෝරාගත්තේ වාමවාදී දේශපාලනයය.

යසපාලිත 1960 දශකයේ සිනමාවට එන්නේ 'වසන්ති' නම් වූ චිත්‍රපටය නිෂ්පාදනය කරමිනි. ඔහු 1973 ලංකාවේ බොක්ස් ඔෆිස් වාර්තා බිඳහෙළමින් 'තුෂාරා' නම් වූ චිත්‍රපටය අධ්‍යක්ෂණය කරද්දී ඔහුගේ සහෝදරයා වාසුදේව 1970 මහ මැතිවරණයෙන් ලංකා සමසමාජ පක්ෂයෙන් ඡන්දය ඉල්ලා පාර්ලිමේන්තුවට තේරී පත්විය. 1970 වනවිට වාසුදේව රැඩිකල් දේශපාලනඥයෙකි. යසපාලිත ජනප්‍රිය චිත්‍රපට අධ්‍යක්ෂවරයෙකි. යසපාලිතගේ හොඳම මිත්‍රයා විජය කුමාරතුංග වන්නේ යසපාලිත විජයව 'තුෂාරා' චිත්‍රපටයෙන් බොක්ස් ඔෆිස් වීරයෙක් කරපු නිසාය.

විජය මුල් කාලයේ දේශපාලනයට බහින්නේ යූ.ඇන්.පී.යෙනි. 1977 මහ මැතිවරණයෙන් විජය දේශපාලනයට එන්නේ ශ්‍රීලනිපයෙනි. විජය ශ්‍රීලනිප දේශපාලනයට එන විට තමන් සමග සිටි සිනමා මිත්‍රයන් දේශපාලනයට සම්බන්ධ කරගන්න සමත් විය. යසපාලිත දේශපාලනයට එන්නේ වාසුදේව නිසා නොව විජය නිසාය.

වාසුදේව 1970 සමසමාජ පක්ෂයෙන් තරග කොට මන්ත්‍රී වී සමගි පෙරමුණු ආණ්ඩුව නියෝජනය කරමින් සිට 1971 ජවිපෙ කැරැල්ලත් සමග වෙනස් විය. වාසුදේවලාගේ අදහස වූයේ ලංකා සමසමාජ පක්ෂයද හවුල් වූ සමගි පෙරමුණු ආණ්ඩුව ජවිපෙ කැරැල්ල මර්දනය කිරීම වැරැදි බවය.

මේ මතගැටුම නිසා වාසුදේවලා සමසමාජ පක්ෂයෙන් ඉවත් වී නව සමසමාජ පක්ෂය පිහිටුවාගෙන බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් යුත් සමගි පෙරමුණු ආණ්ඩුවට එරෙහිව පාර්ලිමේන්තුවේ මල්වඩමක් ගෙනැවිත් ආණ්ඩුව ලැජ්ජාවට පත් කළේය. 1977 මහ මැතිවරණයට වාසුලා, වික්‍රමබාහුලා එක්වී නව සමසමාජ පක්ෂයෙන් ඡන්දේ ඉල්ලුවත් පරාජයට පත්විය.

1977 විජය ශ්‍රීලනිප දේශපාලනයට ආ විට වාසු සහ යසපාලිත විජයගේ නායකත්වයෙන් ශ්‍රීලනිපය ප්‍රමුඛ වාමවාදී සන්ධානයක් හදන්න එක්වෙයි.

## තාත්තා දකුණට යද්දී පුතාලා වමට බරවීම

1982 ජනාධිපතිවරණයට වාසු නව සමසමාජ පක්ෂයෙන් තරග කළත් ලබාගත්තේ ඡන්ද 17,000කි. ශ්‍රීලනිපයෙන් වාමවාදී සන්ධානයකට එරෙහි බණ්ඩාරනායකවරුන්ගේ ඔටුන්න හිමි කුමරා අනුර පක්ෂය තුළ දුර්වල කොට විජයගේ සහ චන්ද්‍රිකාගේ නායකත්වයෙන් ශ්‍රීලනිප-වාමවාදී සන්ධානයක් හදන්න වාසු විජයට එක්වන්නේ මින් පසුවය.

විජය ශ්‍රීලනිපයෙන් ඉවත් වීමෙන් පසු වාසු සහ යසපාලිත විජයගේ අගසව්වන් බවට පත්වේ. 1983 කළු ජූලියට මුවාවී ජේ.ආර්.ගේ ආණ්ඩුව ජවිපෙ සහ වාසුලාගේ නව සමසමාජ පක්ෂය තහනම් කරන්නේ මේ කාලයේය.

ඒත් වාසුලා විජය සහ චන්ද්‍රිකාගේ මහජන පක්ෂයට රහසින් වැඩ කරන්න බය නොවීය.

ජේ.ආර්.ගේ ආණ්ඩුව ඉන්දු-ලංකා ගිවිසුම අස්සන් කළ විට මහජන පක්ෂයත් ලංකා සමසමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, වාසුලා එක්ව එක්සත් සමාජවාදී පෙරමුණ හදා ගිවිසුමට සහාය දක්වන්න තීරණය කරනු ලැබීය. විජය-චන්ද්‍රිකා, වාසු, යසපාලිතලා ජවිපෙ සමග ගේම ඉල්ලන්නේ මේ කාලයේය.

මේ කාලයේ යසපාලිත ඔහුගේ දරුවන් වූ වත්මන් අධිකරණ ඇමැති හර්ෂණලා මාමා වූ වාසුලා ඉන්නේ මර බයේය. ඒ, ජවිපෙ ඉන්දු-ලංකා ගිවිසුමට සහාය දුන් ඔවුන් දේශද්‍රෝහීන් ලෙස සලකලා මරන්න නියෝග කිරීමත් සමගය.

වාසු සහ යසපාලිතලා ජේ.ආර්.ගේ ආණ්ඩුවෙන් ආයුධ ඉල්ලාගෙන පැරා මිලිටරි හමුදා හදාගෙන ජවිපෙට එරෙහි යුද්ධයක් දියත් කරනු ලැබීය.

විජයව ජවිපෙ විසින් ඝාතනය කිරීමත් සමග වාසුදේව සහ යසපාලිත සහෝදරයන් අනාථ වේ. ඔවුන්ගේ අනෙක් සහෝදරයා වූ හේමකුමාර නානායක්කාර දේශපාලනයට එන්නේ මේ කාලයේය.

1989 මහ මැතිවරණයට වාසු එක්සත් සමාජවාදී පෙරමුණෙන් ඉල්ලන විට හේමකුමාර ශ්‍රීලනිපයෙන් ඡන්දය ඉල්ලුවේය.

දෙදෙනාම පාර්ලිමේන්තුවට තේරී පත්විය. වාසු මහින්ද රාජපක්ෂ සමග එක්වී ජේ.ආර්. සහ ප්‍රේමදාස ආණ්ඩු විසින් මර්දනය කළ ජවිපෙ පවුල් වෙනුවෙන් ජිනීවා යන්නේ මේ කාලයේය. 1994 චන්ද්‍රිකා ශ්‍රීලනිපයේ අනාගත නායිකාව ලෙස මතුව එද්දී හේමකුමාර අනුර සමග එක්වේ. ඒත් වාසුදේව චන්ද්‍රිකාට එක්වී 1994 මහ මැතිවරණයට පොදු පෙරමුණෙන් තරග කොට පාර්ලිමේන්තුවට තේරීපත්වේ.

හේමකුමාර සහ යසපාලිත අනුර සමග යූ.ඇන්.පී.යට එක්වේ. හේමකුමාර යූ.ඇන්.පී. මන්ත්‍රීවරයකු බවට පත්වේ. වැඩි කල් නොගොස් වාසුදේව චන්ද්‍රිකාගේ විවෘත ආර්ථික ප්‍රතිපත්තියට සහ පුද්ගලීකරණ ප්‍රතිපත්තියට එරෙහි වී ආණ්ඩුවෙන් ඉවත් වෙයි.

2005 මහින්ද කරළියට එන විට යසපාලිත මියගෙ ාසින්ය. චන්ද්‍රිකාට එරෙහි වූ වාසු මහින්දට එක්වෙයි. හේමකුමාර යූ.ඇන්.පී.ය දිනවන්න වැඩ කළේය. 2007 යූ.ඇන්.පී.යේ 17 දෙනෙක් මහින්දගේ දෑත් ශක්තිමත් කරන්න එක්වෙද්දී හේමකුමාර මහින්ද සමග එක්වී ඇමැතිවරයෙක් විය.

එතකොට වාසු මහින්දගේ ශ්‍රීලනිපයෙන් කොළඹ නගර සභාවට තරග කොට පරාජය වී විපක්ෂ නායක වී සිටියේය. 2010 වාසු යළිත් පාර්ලිමේන්තු ආවේය. හේමකුමාරට පාර්ලිමේන්තු යන්න බැරිවී මහින්දගේ උපදේශකයෙක් විය.

2015 ජනාධිපතිවරණයේදී වාසු මහින්දව දිනවද්දී හේමකුමාර මහින්දව අත්හැර මෛත්‍රීපාලට එක්වී මෛත්‍රීපාල දින්නාට පසු ආණ්ඩුකාර ධුරයට පත්විය.

2015 පරාජයට පසු යළි මහින්දව නැගිට්ටවන විමල්, උදය, දිනේෂ් හවුලේ ප්‍රධාන භූමිකාවක් කරන්නේ වාසුය. 2019 ජනාධිපතිවරණයට වාසු සහ හේමකුමාර එක්වී ගෝඨාභයට සහාය දෙනු ලැබීය.

මහප්පලා තාත්තලා දේශපාලනය කරන කාලයේ යසපාලිතගේ පුතා හර්ෂණ කුඩා දරුවෙකි. යසපාලිතට ඕනා වෙන්නේ ඔහුව ජනප්‍රිය නළුවෙකු කරන්නටය. ඔහු සිනමාවට එන්නේ ළමා චරිත රඟපාමින් 'ඇගේ ආදර කතාවෙන්'ය. ඒ චිත්‍රපටයත් ඔහුගේ පියාගේ චිත්‍රපටයකි. ඔහු සිනමා තරුවක් ලෙස රඟපාන්නේ සංගීතා වීරරත්න සමග 'යසස' චිත්‍රපටයේය.

ඒත් ඔහුගේ සිනමා ජීවිතය සාර්ථක නොවේ. තම පියා යසපාලිතත් තම මහප්පා වාසුදේවත් ජීවිතය සහ මරණය අතර සටනක් කළ ජවිපෙන් දේශපාලනයට එන්න ඔහු තීරණය කරන්නේ ජාතික ජන බලවේගයෙනි.

තම මතවාදයට එරෙහිව සිටි තම පක්ෂය සමග මරාගෙන මැරෙන යුද්ධයක් කළ පවුලක සාමාජිකයකුට ජවිපෙ අධිකරණ ඇමැති ධුරය දීම දෛවෝපගත සිද්ධියකි.

ජවිපෙ සමග ජන්මාන්තර වෛරයක සිටි වාසු දැන් තම බෑණාගේ ආණ්ඩුවේ හොඳ දකිමින් සිටී. හේමකුමාර බෑණාට ඉඩදී දේශපාලනයෙන් ඉවත් විය.

වාසුගේ දුව විවාහ කරගත් උතුරේ මහඇමැති විග්නේෂ්වරන්ද දැන් ඥාති පුතා අධිකරණ ඇමැති ධුරය දරන ආණ්ඩුව වර්ණනා කරමින් සිටී. පසුගියදා නානායක්කාර පවුලේ ඔටුන්න හිමි කුමාරයා හර්ෂණ නානායක්කාර විශ්වාසභංගයකට මුහුණ දුන්නේ සිරගෙ දර කෝලාහලය මැඩපවත්වන්න අධිකරණ ඇමැති ලෙස ඔහු අසමත් වූ නිසාය.

## පවුල් දේශපාලනය ජවිපෙ ඉවර කළාද?

තාත්තාව මහප්පාව මරන්න හොයපු ජවිපෙ අද පුතාව ඒ විශ්වාසභංගයෙන් ආරක්ෂා කරනු ලැබීය.

මිනිස්සු හිතුවේ පවුල් දේශපාලනය ඉවරයි කියාය. හැබැයි නානායක්කාරලා පවුල් දේශපාලනයට තිත තියන්න ආපු ජවිපෙ ලව්වා ඔටුන්න හිමි කුමාරයෙක් හදන්න සමත්වී ඇත.

උපුල් ජෝශප් ප්‍රනාන්දු

# ලංකාවේ ඉංග්‍රීසි ටීචර් සහ FAKE NEWS





**පසුගිය දින කිහිපය පුරා ලංකාවේ සමාජ මාධ්‍ය පරිශීලකයන් අතර දැඩි කතාබහට ලක්වූ, එසේම බොහෝ දෙනකුගේ අතින් දැඩි විවේචනයට සහ චරිත ඝාතනයට ලක්වූ ඡායාරූප සහ වීඩියෝ පෙළක් ඔබත් දකින්නට ඇත.**

'මෙන්න ලංකාවේ ප්‍රමුඛ පෙළේ බාලිකා පාසලක ඉංග්‍රීසි ටීචර්ගේ වැඩ... මැලේසියාවේ තරගයකට ගිහින් බිකිනියකින්... විදුහල්පතිනියගෙන් විනය පියවර ඉල්ලයි' වැනි උණුසුම් සහ නොමග යවන සුළු මාතෘකා යොදමින්, ෆේස්බුක්, ටික්ටොක් සහ යූටියුබ් හරහා මෙම පුවත ලැව්ගින්නක් සේ පැතිර ගියේය. නමුත්, Fact-Check පරීක්ෂාවලදී හෙළිවූ සැබෑ සත්‍යය කුමක්ද?

ඇය ලංකාවේ ගුරුවරියක්ද? කොහෙත්ම නැත. අදාළ ඡායාරූපවල සිටින යුවතිය ශ්‍රී ලංකාවේ පදිංචිකාරිනියක්වත්, මෙරට පාසලක ඉංග්‍රීසි උගන්වන ගුරුවරියක්වත් නොවේ. ඇය ලතින් ඇමෙරිකානු රටක් වන ගුවාතමාලාවේ පදිංචි ජෙයිමි ස්ටෙෆනි හර්නැන්ඩෙස් රෙයිනා නමැති 25 හැවිරිදි තරුණියකි. ඇය Universidad Rafael Landivar හි සමාජ වැඩ (Social Work) පිළිබඳ තාක්ෂණික උපාධිධාරිනියකි.

තරගය පැවැත්වුණේ මැලේසියාවේද? නැත. මෙය මැලේසියාවේ පැවැති ජාත්‍යන්තර තරගයක් නොවේ. මෙය 2026 ජූලි 11 වැනි දින ගුවාතමාලාවේ Alta Verapaz පළාතේ Coban නගර සභාව මගින් සංවිධාන කරන ලද Nuestra Belleza Monja Blanca 2026-2027 ප්‍රාදේශීය රූ රැජින තරගයයි.

මෙම තරගයේ නගර සභා 17ක් නියෝජනය කරමින් ඉදිරිපත් වූ තරගකාරියන් 15 දෙනා අතුරින් අවසන් වටයට තේරීපත්වුණු මෙම තරගකාරියගේ පිහිනුම් ඇඳුම් (Swimwear) වටයේ ඡායාරූප මෙලෙස ලංකාවේ සංවේදී පුවත් මවාපාමින් Likes/Views ලබාග න්නා පිටු විසින් අවභාවිත කර තිබුණි.

මෙම ව්‍යාජ පුවත හරහා සමාජයේ අතිශය වැදගත් මාතෘකාවක් කරළියට පැමිණියේය. ඒ 'ගුරුවරියකට හෝ වෙනත් වෘත්තිකයෙකුට තරගයකදී බිකිනියක් ඇඳීම අකැපද?' යන්නයි.

පාසලක් හෝ පන්ති කාමරයක් තුළ සාරිය හෝ සුදුසු වෘත්තීය ඇඳුම ඇඳීම ගුරුවරියකගේ වගකීමයි. නමුත් පාසලෙන් පිටත, කායවර්ධන,මෝස්තර නිරූපණය හෝ පිහිනුම් වැනි තරගයකට ඉදිරිපත් වන විට, ඒ ඒ ක්ෂේත්‍රයට අදාළ නිල ඇඳුම ඇඳීම එම තරගාවලියේ ප්‍රමිතිය සහ නීතියයි.

වෘත්තිය කුමක් වුවත්, තමන්ගේ පෞද්ගලික කාලය තුළ නීත්‍යානුකූල ක්‍රීඩාවක නිරත වීමට ඕනෑම අයෙකුට අයිතියක් ඇත. ඇඳුම මත පමණක් පදනම් වී කෙනකුගේ චරිතය හෝ වෘත්තීය ගෞරවය මැනීම අතීතකාමී සමාජ අගතීන්ගේ ලක්ෂණයකි.

මෙම සිදුවීමෙන් නැවත වරක් තහවුරු වූයේ අපේ සමාජ මාධ්‍ය භාවිතය කෙතරම් පරිණත නැතිද යන්නයි.

ඡායාරූපයක් දුටු සැණින් ඒ පිළිබඳ Google Reverse Image Search එකක් දමා හෝ සත්‍යාපනය කරගැනීමට තරම් තාක්ෂණික දැනුමක් හෝ ඉවසීමක් අපේ බහුතරයකට නැත. සත්‍ය තොරතුරු සෙවීම පසෙකලා, 'සංස්කෘතිය' පෙරට දමාග නිමින් නොදන්නා කාන්තාවකට කුණුහරුපයෙන් බැණවැදීමට සහ චරිත ඝාතනය කිරීමට බොහෝ දෙනෙක් කැමැතිය.

අද රටේ පවතින අධ්‍යාපනයේ සැබෑ ප්‍රශ්න ගැටලු ගැන කතාකිරීමට වඩා අන් අයගේ පෞද්ගලික ජීවිතයට එබිකම් කිරීමට සමාජය දක්වන රුචිකත්වය මෙයින් පෙන්නුම් කෙරේ.

අවසාන වශයෙන්... අන්තර්ජාලයේ දකින ඕනෑම බොරුවක් ඇත්ත කියා අදහාගන්නා, තොරතුරු සොයා නොබලන සමාජයකින් බිහිවන්නේ රැවටීමට ලක්වෙන ජනතාවකි. සමාජ මාධ්‍යවල දකින සෑම දෙයක්ම ෂෙයාර් කිරීමට හෝ ඒ මත පදනම්ව කෙනෙකුට අපහාස කිරීමට පෙර, එහි ඇත්ත නැත්ත සොයාබලන බුද්ධිමත් පරිශීලකයන් බවට පත්වීම අප සියල්ලන්ගේම වගකීමකි.

*Thilini Warushawithana*






## කැරපොත්තෝ ඉන්දියාව ආක්‍රමණය කරයි

# ගෝඨාට වෙච්ච දේ මෝදිටත් වෙයිද?

**මේ දිනවල ඉන්දියාවේ පටන් අරගෙන තියෙන 'අරගලය' ලංකාවෙ අරගලයට සමානයි වගේම සමහර අතින් අසමානයි. ලංකාවේ අරගලය ගැන අත්දැකීම නිසා ගොඩක් අය ඒකත් ලංකාවෙ වගේම එකක් කියල හිතනවා. නමුත් ඇත්තටම ගත්තොත් ඒක ලංකාවෙ අන්තරේ සටනක් (සයිටම් වගේ) සහ 2022 අරගලය කියන අතර අතරමැද තැනක තමයි තියෙන්නෙ. පිටත ස්වරූපයෙන් ලංකාවේ අරගලය වගේ පෙනුණට හරයෙන් ඒක වඩා සමීප වෙන්නෙ සයිටම් සටන වැනි අන්තරේ සටනකට.**

දෛවෝපගත විදියට මේකෙත් මූලාරම්භය තියෙන්නෙ වෛද්‍ය අධ්‍යාපනයට ප්‍රවේශ වන්නේ කෙසේද කියන ප්‍රශ්නය. ඉන්දියාවේ ඒ ප්‍රවේශ විභාගයක සිදුවුණු දූෂණයක් තමයි මේ සිද්ධි දාමයේ ආරම්භය. ලංකාවේ සයිටම් සටන කියන්නෙත් වෛද්‍ය අධ්‍යාපනය දිය යුත්තේ කාටද කියන ප්‍රශ්නය මුල්කර ගත්තු එකක්නෙ. ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනයට තියෙන ප්‍රවේශ විභාගය ඉතාමත්ම තරගකාරී එකක් වෙනවා වගේම ඉන්දියාවේ වෛද්‍ය අධ්‍යාපනයට ප්‍රවේශ වීම සඳහා සුදුසුකම් ලැබීමට තියෙන විභාගයත් ඉතාමත්ම තරගකාරීයි. ඉතින් ඒ සම්බන්ධයෙන් ඇතිවන දූෂණයක් හෝ අක්‍රමිකතාවක් ඒ විභාගයට පෙනී ඉන්න තරුණයෙක්ට දරාගන්න බැරි දෙයක් වීම තේරුම් ගන්න පුළුවන්.

මෙතැනදී ලංකාව සහ ඉන්දියාව අතර ඇති ප්‍රධාන වෙනසක් තමයි ඉන්දියාවේ ඔය විභාගය කොහොමටත් අවුරුදු ගානක් තිස්සේ දූෂිතයි කියලා විශ්වාස කෙරුණු එකක්. මේ සැරේ සිදුවීම ඒකෙ කූටප්‍රාප්තියක් විතරයි. නමුත් ලංකාවේ රාජ්‍යය මැදිහත් වෙලා පවත්වන දේවල්වලින් දූෂණයට සහ දේශපාලන අතපෙවීම්වලට කිසිම ඉඩක් නෑ කියන්න තිබුණු එකම දේ තමයි උසස් පෙළින් විශ්වවිද්‍යාලයට ඇතුළත් කරගැනීම. ලංකාවෙදි මුලින් උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාල සටනත් පසුව සයිටම් සටනත් පැන නගින්න හේතු වුණේ ඒ සාධාරණ ක්‍රමවේදයට පිටින් මුදල් බලය සහ දේශපාලන බලය භාවිත කරලා වෛද්‍ය උපාධි ලබාගැනීමේ මාවතක් විවෘත කර ගන්න යම් ප්‍රබල පිරිසක් උත්සාහ කිරීම.

ලංකාවේ සහ ඉන්දියාවේ තියෙන සමානකම තමයි ඒ සමාජ දෙක තුළ ඔඩු දුවලා තියෙන වංචාව හා දූෂණය මේ වෛද්‍ය අධ්‍යාපන සිදුවීම් දෙක තුළින් පිළිබිඹුවීම. නමුත් ලංකාවෙදි සයිටම් සටන පොදු සමාජ අරගලයක් බවට පත්වුණේ නැහැ. ඒ වෙනුවට සිද්ධ වුණේ වෛද්‍ය ශිෂ්‍යයන් සහ අන්තරයේත්, කුඩා වාමාංශික සංවිධානවලත්, අධ්‍යාපනය පිළිබඳව උනන්දුවක් තියෙන සුළු පිරිසකගේත් සටනක් පමණක් බවට එය පත්වීම.

ලංකාවේ අතිබහුතරයක් දෙනාට ලෝකයේ වෛද්‍ය අධ්‍යාපනය සංවිධාන වෙලා තියෙන ආකාරය ගැන නිසි අවබෝධයක් නැති නිසා එයාලා ඇත්තටම විස්මයජනක ලෙස ගත්තේ දූෂිත දේශපාලනඥයන්ගේ සහ සයිටම් එක හා සම්බන්ධ ජාවාරම්කාරයන්ගේ පැත්ත. ඒ අනුව සයිටම් සටන ලංකාවේදී කිසිම විදියකින් ආණ්ඩු පෙරළන මට්ටමේ මහජන සටනක් බවට පත්වුණේ නෑ. ඒ වෙනුවට සිද්ධ වුණේ වංචාවට දූෂණයට විරුද්ධව කතා කරන අය පවා නිශ්චිතවම මහ දවල් වංචාවක් වූ සයිටම් එකට පක්ෂපාත වීම. ඒ වගේම නිසි සාධාරණ ක්‍රමවේද තුළින් කුසලතාව සහිත ශිෂ්‍යයන්ට වෛද්‍ය අධ්‍යාපන ප්‍රවේශය ලබාදීම ලංකාවේ ජාතික උරුමයක් ලෙස දකිනවා වෙනුවට ඒක ලංකාවෙ තියෙන වහාම නිවැරදි කළ යුතු වැරැද්දක් ලෙස දකින තැනට සමහරු පත්වුණා.

ලංකාවේ ආණ්ඩුවක් ගෙදර යවන සටන ඒ අනුව ආවේ අධ්‍යාපන සටනක් පසුව සමාජ අරගලයක් බවට වර්ධනය වීමෙන් නෙවෙයි. ඒක ආවේ ගෑස් පෙට්‍රල් විදුලිය ආහාර බෙහෙත් නැතිවෙලා රට බංකොලොත් වුණාම. ඒ කියන්නේ ගෑස්, විදුලිය, පෙට්‍රල් නැතිවීම කියන එකේ හේතුව ලෙස දේශපාලනයෙහි අරක්ගෙන තියෙන වංචාව, දූෂිතභාවය, ඥාති සංග්‍රහය වගේ දේවල් මිනිස්සුන්ට පෙනෙන්න ගැනීමයි ලංකාවෙදි වුණේ. ඒ මිසක් වෛද්‍ය අධ්‍යාපනය වගේ සීමිත පිරිසකට බලපාන ප්‍රශ්නයක් නෙවෙයි මුළු සමාජයටම බලපාන ප්‍රශ්නයක් තමයි ලංකාවේ අරගලයට හේතු වුණේ.

ඉන්දියාවේ වර්තමාන 'කොක්රෝච් අරගලය' දිහා බැලුවම පේන දේ තමයි ඒක හරයෙන් ලංකාවේ සයිටම් සටන වගේ සටනක්. ලංකාවේ සයිටම් සටන මහා ජන අරගලයක් බවට පත්වුණේ නැහැ. නමුත් බංග්ලාදේශයේ ඊට සමාන ප්‍රශ්නයක් වුණු ඉහළ වෘත්තීන්ට තරුණයන් බඳවා ගැනීමේ ක්‍රමය මහජන අරගලයක් බවට පත්වෙලා ආණ්ඩුව ගෙදර ගියා.

ඒ කියන්නෙ සමහර වෙලාවල්වලට ඒ වගේ පුංචි එළිවලින් මහා සමාජයේ ඇති ලොකු ප්‍රශ්න දකින්න මහජනයාට පුළුවන් වෙනවා. වෙනත් වෙලාවට මෙහෙම දැල්වෙන එළි ටික කාලෙකට දැල්විලා පස්සේ නිමිලා යනවා. මහා සමාජයට ඒකෙන් ලොකු බලපෑමක් වෙන්නෙ නැහැ.



දැන් ඉන්දියාව සම්බන්ධයෙන් මතුවන ප්‍රශ්නය තමයි ඔය දෙකෙන් කොයික වෙයිද කියන එක. දැනට විශාල තරුණ පිරිසක් මේ ව්‍යාපාරයට ආකර්ෂණය වෙලා තියෙනවා කියන එක පැහැදිලියි. ඒ කියන්නෙ මේක සයිටම් මට්ටම පැනලා තියෙන්නේ. නමුත් පැහැදිලිවම තවම ඒක ලංකාවේ 2022 අරගලය මට්ටමට ඇවිල්ලා නැහැ. ලංකාවේ අරගලයේදී සේවකයෝ දහය දොළහා ඉන්න ආයතන ඉස්සරහ පවා අතින් ලියපු බෝඩ් කෑලි උස්සගෙන මිනිස්සු ඒ අරගලයට සම්බන්ධ වුණා. පොඩි හන්දිවල දහය විස්ස එකතුවෙලා සටන් පාඨ කිව්වා. ඒක වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම පුළුල් මහජන අරගලයක්. නමුත් තවමත් ඉන්දියාවේ ඔය කියන අරගලය ලංකාවේ අරගලයේ ආසන්නයටවත් ඇවිල්ල නෑ. ඒක තවම සයිටම් සටනට වඩා වැඩි සටනක් විතරයි.

නමුත් මේ සටනෙන් ඉන්දියාවේ මෝඩිලගේ බලය පොඩ්ඩක් හරි ඉරිතළන්න පුළුවන්. ඒ වගේම සටන් ආවේගයක් සඳහා අවශ්‍ය පුංචි ගිනි පුපුර මේක වෙන්න පුළුවන්. ඒක තීරණය වෙන්නේ අනාගතයේදී.

(ලංකාවෙ අපිට දැන් අමතක වෙලා තිබුණට තිබුණට ලංකාවේ අරගලය පටන් ගන්න මූලික හේතු වුණේ ජෝෂප් ස්ටාලින් ඇතුළු ගුරුවරු පිරිසක් උද්ඝෝෂණය කළාම එයාලව කෝවිඩ් නීතිය පාවිච්චි කරලා අත්අඩංගුවට අරගෙන බස් එකක දාගෙන අරන් ගිය මොහොතෙන්. ඒ ගුරු අරගලය අපිට දැන් අමතකයි. නමුත් ගෝඨාභය වැටෙන්න පටන් ගත්තේ එතැනින්).

*Anuruddha Pradeep Karnasuriya*





කපිල පුංචිමාත්තගේ

රාජ්‍ය රහස්

# ට්‍රම්ප් අනුරව අමාරුවේ දමයි

## සජිත් සහ රාහුල් එකම ගේමකද?

**2022 වසරේ ගෝඨාභය රාජපක්ෂ රජයට ගෝල්ෆේස්හි ආරම්භ වූ 'ගෝඨා ගෝ හෝම්' ජනතා අරගලය සිහිග න්වමින් ඉන්දියාවේද පාලක නරේන්ද්‍ර මෝදිගේ රජයට එරෙහිව දැවැන්ත ජනතා අරගලයක් ආරම්භ වී ඇති ආකාරයක් මෙ දිනවල ඉන්දියාවේ සිදුවන සිදුවීම්වලින් දැකගන්නට පුළුවන. ලංකාවේ සිදුවුණා මෙන්ම මේ වනවිට ඉන්දියාවේද මේ ජනතා අරගලය නොනිදන එකක් බවට පත්ව ඇති අතර, ලංකාවේ මෙන්ම සිනමා තරුවල, ක්‍රීඩකයන්ගේ සහ ප්‍රකට චරිතවල ආශිර්වාදයද ඊට ලැබෙමින් පවතින ආකාරයක් දැකග න්නට පුළුවන.**

මෙම අරගලයට සමගාමීව ඉන්දියාවේ විපක්ෂ නායකවරයා වන රාහුල් ගාන්ධි පසුගිය බදාදා දිනයේදී එරට විපක්ෂයේ සියලු පක්ෂ නායකයන් ඒකරාශී කරමින් මෝදිගේ ආණ්ඩුවට එරෙහිව දැවැන්ත අරගලයක් දියත් කිරීමට සූදානම් වන ආකාරයක් දැකගන්නට තිබිණි.

ඉන්දියාවේ මේ වනවිට ආරම්භ වී ඇති උද්ඝෝෂණ රැල්ල පිළිබඳ සිහිකරමින් සහ ඉන්දීය විපක්ෂ නායකවරයාගේ භූමිකාව සම්බන්ධයෙන් සටහනක් තබමින් මෙවර 'රාජ්‍ය රහස්' තීරය ආරම්භ කළේ ලංකාවේද මේ වනවිට එවැනිම ආකාරයේ සිදුවීම් දාමයක් ක්‍රියාත්මක වෙමින් පවතින නිසාය. මේ වනවිට ඉන්දියාවේ ශිෂ්‍යයන් පාරට බැස ඇති ආකාරයට ලංකාවේ ගොවීන්ද ආණ්ඩුවට එරෙහිව පාරට බැස ඇති අතර, ඉන්දියාවේ විපක්ෂ නායක රාහුල් ගාන්ධි අගමැති මෝදිට එරෙහිව මුළු විපක්ෂයම එකතු කරමින් සිටින ආකාරයට මෙරට විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතාද මාලිමා ආණ්ඩුවට එරෙහිව සමස්ත විපක්ෂයම එකතු කිරීමට කටයුතු කරමින් සිටින ආකාරයක් දැකග න්නට තිබේ.

සජිත් මෙසේ ආණ්ඩුවට එරෙහිව විපක්ෂයේ සියලු බලමුළු ඒකාබද්ධ කිරීමට තීරණය කළේ ආණ්ඩුව විසින් අගවිනිසුරු සහ උපරිමාධිකරණ විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස අවුරුදු දෙකකින් දීර්ඝ කිරීම සඳහා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් ගෙන ඒමට කටයුතු කරමින් සිටීම නිසාය. මෙම තොරතුර වාර්තා වීමත් සමග සජිත් පළමුවෙන්ම කළේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු විපක්ෂයේ දේශපාලන පක්ෂ ඊට එරෙහිව ඒකාබද්ධ කිරීමට පියවර ගැනීමය. ඒ අනුව පසුගිය සතියේදී පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක කාර්යාලයේ විශේෂ සාකච්ඡාවක් පැවැත්වීමටද සජිත් කටයුතු කොට තිබිණි. සජිත් එසේ කළේ ඒ වනවිටත් ශ්‍රී ලංකා නීතිඥ සංගමය, ආසියානු නීතිඥ සංගමය, පොදුරාජ්‍ය මණ්ඩලයීය නීතිඥ සංගමය, දිසා අධිකරණ සහ මහෙස්ත්‍රාත් අධිකරණවල නීතිඥ සංගම් මෙන්ම විනිසුරුවරු නියෝජනය කරන අධිකරණ සේවා සංගමයද ආණ්ඩුවේ මෙම වැයමට එරෙහිව ප්‍රසිද්ධියේම අදහස් පළකොට තිබූ පසුබිමකය.

## රනිල්ටත් කතාකරයි

**කෙසේ වෙතත් මෙහිදී පාර්ලිමේන්තුව නියෝජනය කරන පක්ෂ පමණක් නොව, පාර්ලිමේන්තුව නියෝජනය නොකරන පක්ෂ සහ සංවිධානද මෙම සාකච්ඡාව සඳහා එක්කර ගන්නා ලෙස දැනුම් දෙමින් මීට සති දෙකකට පෙර පොහොට්ටුවේ ජාතික සංවිධායකවරයා වන නාමල් රාජපක්ෂ සජිත්ට ලිපියක් යොමු කරමින් දැනුම් දීමක් කර තිබිණි.**

ඊට ප්‍රතිචාර දක්වමින් සජිත් පාර්ලිමේන්තුවේ පමණක් නොව ඊට පිටත සිටින සියලු පක්ෂ නායකයන් සහභාගි වන විශේෂ රැස්වීමක් විපක්ෂ නායක කාර්යාලයේ කැඳවීමට පියවර ගත්තේය. මේ සම්බන්ධයෙන් පසුගිය සතියේ රාජ්‍ය රහස් තීරය ඔස්සේ විශේෂ අනාවරණයක් කරමින් අප කියා සිටියේ සජිත් පෞද්ගලිකවම එජාප නායක රනිල් වික්‍රමසිංහට, නාමල් රාජපක්ෂට, මෛත්‍රීපාල සිරිසේන ඇතුළු සියලු පක්ෂ නායකයන්ට කතාකොට ඊට ආරාධනා කිරීමට පියවර ගත් බවය. ඒ අනුව 23 වැනිදා පස්වරුවේ විපක්ෂ නායක කාර්යාලයේදී එම හමුව සංවිධාන කොට ඇති බවද සජිත් එහිදී සියලු දෙනාටම දැනුම් දී සිටියේය.

කෙසේ වෙතත් මෙහිදී කිහිප දෙනකුට මුලින්ම මතුවූ ගැටලුව වූයේ මෙම රැස්වීම විපක්ෂ නායක කාර්යාලයේ පැවැත්වීමය. බොහෝ දෙනා ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින් කියා සිටියේ ඇතැම් පක්ෂ නායකයන් විපක්ෂ නායක කාර්යාලයේ පවත්වන රැස්වීම්වලට සහභාගි වීමට අකමැත්තෙන් පසුවන බවත්, ඒ නිසා සියල්ලන්ටම එකඟ විය හැකි පොදු ස්ථානයක්, එසේත් නොමැති නම් හෝටලයක් ඒ සඳහා යොදාගතහොත් සුදුසු බවත්ය. එම යෝජනාව පාර්ශ්ව කිහිපයකින් සජිත්ට දැනුම් දීමෙන් පසුව සජිත් තමාට කතා කළ සියල්ලන්ටම කියා සිටියේ විපක්ෂ නායක කාර්යාලය යනු පෞද්ගලික ස්ථානයක් නොවන බවත්, විපක්ෂයේ සියලු දෙනාටම පැමිණ සාකච්ඡා කළ හැකි පොදු ස්ථානයක් බවත්, එය විපක්ෂයේ සියලු දෙනාටම අයිති රජයේ පොදු දේපළක් බවත්ය. එම නිසා විපක්ෂයේ සියලු දෙනාම සහභාගි වන සාකච්ඡාවක් පවත්වන්නේ නම් අනිවාර්යයෙන්ම එය විපක්ෂ නායක කාර්යාලයේ පැවැත්විය යුතු බවට වූ දැඩි ස්ථාවරයේ සජිත් දිගටම සිටි ආකාරයක් දැකග න්නට ලැබිණ. ඒ හේතුව නිසාම මෙම සාකච්ඡාව පොදු ස්ථානයක පැවැත්විය යුතු බවට වූ යෝජනාව ක්‍රමයෙන් යටපත් වී ගිය ආකාරයක් දැකගත හැකි විය. එමෙන්ම විපක්ෂ නායක කාර්යාලයේ මෙම සාකච්ඡාව පැවැත්වීම සම්බන්ධයෙන් ඇතැම් පක්ෂ නායකයන් අතර තිබූ විරෝධයට මැදිහත් වීමට එජාප නායක රනිල් වික්‍රමසිංහද කටයුතු කර තිබිණි. එහිදී කිහිප දෙනකුටම කතාකොට රනිල්ද කියා සිටියේ එය අවුලක් කර නොග න්නා ලෙසත්, සියලු දෙනාම මේ සම්බන්ධයෙන් විපක්ෂනායක කාර්යාලයේදී එක්වී සාකච්ඡා කිරීම හරහා යම් පණිවුඩයක් ආණ්ඩුවට ලබාදීමට හැකියාව පවතින බවත්ය.

ඉන් අනතුරුව සංවිධාන කටයුතු සිදුකරද්දීදී පැනනැගුණු තවත් ප්‍රශ්නයක් වූයේ සාකච්ඡාව සඳහා පැමිණෙන පක්ෂ නායකයන් පිළිගනු ලබන්නේ කවුරුන් විසින්දැයි කියාය. එහිදී විවිධ යෝජනා ඉදිරිපත් වුවත් අවසානයේදී සජිත් කියා සිටියේ සියලු පක්ෂ නායකයන් පැමිණෙන්නේ තමන් කළ ආරාධනාවකට අනුව නිසා විපක්ෂනායකවරයා වශයෙන් තමන් විසින්ම එම පක්ෂ නායකයන් පිළිගැනීමට කටයුතු කිරීම සුදුසු බවකි. ඒ අනුව සජිත් ඉදිරිපත් කළ යෝජනාවට සියල්ලන්ගේම එකඟතාව පළවූ ආකාරයක් දැකගන්නට ලැබිණි.

## පුටු දාන්නේ කොහොමද?

**එමෙන්ම සාකච්ඡාවේ ප්‍රධාන මේසය සහ ආසන සකස් කළ යුතු අන්දම පිළිබඳවද මෙහිදී කතාබහක් සිදුවිය. ඒ අනුව මුලින්ම යෝජනා වී තිබුණේ හිටපු ජනාධිපතිවරුන් වන මෛත්‍රීපාල සිරිසේන මහතාටත්, රනිල් වික්‍රමසිංහ මහතාටත්, හිටපු අගමැති දිනේෂ් ගුණවර්ධන මහතාටත්, විපක්ෂ නායකවරයාටත් ප්‍රධාන මේසයේ ආසන පැනවිය යුතු බවකි.**

එම යෝජනාව ස්ථිර වී තිබුණද හදිසියේම මෛත්‍රීපාල සිරිසේන මහතා කතාකොට තමන්ට මීට පෙරාතුව පොළොන්නරුවේ යොදාගෙන තිබූ පින්කම් කටයුත්තකට අනිවාර්යයෙන්ම සහභාගි වීමට සිදුව ඇති නිසා මෙම රැස්වීමට සහභාගි විය නොහැකි බව දැනුම් දී තිබීම මත එම ආසනය සජබ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාරට වෙන් කිරීමට තීන්දු විය. එමෙන්ම අනෙකුත් පක්ෂ නායකයන්ට ආසන වෙන්කරන ආකාරය පිළිබඳවද එහිදී අවසන් තීන්දුවකට එළඹීමට සජබ නායකයෝ පියවර ගත්හ.

මීට අමතරව සාකච්ඡාවෙන් අනතුරුව පක්ෂ නායකයන්ට සංග්‍රහ කරන ආකාරය පිළිබඳවද සජබ ජ්‍යෙෂ්ඨයන් අතර සාකච්ඡාවක් සිදුවිය. එහිදී විවිධ යෝජනා පැමිණියද බොහෝ දෙනා කියා සිටියේ මෙය ඉතා විශේෂ අවස්ථාවක් බැවින් ප්‍රසිද්ධ හෝටලයකින් ආහාර පාන ඇණවුම් කර පැමිණෙන පක්ෂ නායකයන්ට සංග්‍රහ කළ යුතු යැයි කියාය. ඊට සජිත්ගේද එකඟතාව පළවිය.

## මෙන්න ආපු අය

**ඒ අනුව පසුගිය බ්‍රහස්පතින්දා දිනයේ විපක්ෂ නායක කාර්යාලයට විපක්ෂයේ සියලු පක්ෂ නායකයන් පැමිණි ආකාරයක් දැකගන්නට ලැබිණි. ඒ අතර එජාප නායක රනිල් වික්‍රමසිංහ, දිනේෂ් ගුණවර්ධන, රවුෆ් හකීම්, නාමල් රාජපක්ෂ, රවි කරුණානායක, ගජේන්ද්‍ර පොන්නම්බලම්, මනෝ ගනේෂන්, ජී.එල්. පීරිස්, පලනි දිගම්බරම්, ආරුමුගම් තොණ්ඩමන්, පාඨලී චම්පික රණවක, අසංක නවරත්න, චාමර සම්පත් දසනායක, නිමල් සිරිපාල ද සිල්වා, දිලිත් ජයවීර, විමල් වීරවංශ, උදය ගම්මන්පිල, මහින්ද අමරවීර, වීරාන් අලස්, මෛත්‍රී ගුණරත්න ඇතුළු විශාල පිරිසක් එක්ව සිටි ආකාරයක් දැකගත හැකි විය.**

ඒ සියලු දෙනාම විපක්ෂ නායක කාර්යාලයේ ප්‍රධාන දොරටුව අසලදී ඉතා උණුසුම් ආකාරයෙන් පිළිගැනීමට සජිත් කටයුතු කළේය. කලකට පසු සජිත් ප්‍රසිද්ධියේ රනිල්ට අතට අත දුන් පළමු අවස්ථාව ලෙසද මෙය වාර්තා විය.

නිල සාකච්ඡාව ආරම්භ වූයේ ඉන් අනතුරුවය. ප්‍රධාන වශයෙන් සාකච්ඡාව කේන්ද්‍රගත වී තිබුණේ ආණ්ඩුව විසින් අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑම් එල්ල කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන්ය. මෙහිදී පැමිණි සියලු දෙනා පිළිගනිමින් සජිත් කියා සිටියේ දේශපාලන මතවාද, ප්‍රතිපත්ති කුමක් වුවත් ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීමේ ක්‍රියාවලියේදී පක්ෂ පාට නොතකා අත්වැල් බැඳගෙන අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම වෙනුවෙන් සජබය පෙනීසිටින බවය. මීට අමතරව අධිකරණයට බලපෑම් කිරීමට උත්සාහ කළ සියලු ආණ්ඩු අතීතයේදී ජනතාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ බව පෙන්වා දුන් සජිත්, වත්මන් ආණ්ඩුවටද එම ඉරණමටම මුහුණ දීමට සිදුවනු ඇති බව ද සඳහන් කර සිටියේය.

මෙහිදී සජිත්ට දකුණු පැත්තෙන් අසුන්ගෙන සිටි රනිල්ද සිය කතාවේදී පෙන්වා දුන්නේ ආණ්ඩුව සිදුකිරීමට සූදානම් වන මෙම ව්‍යවස්ථා සංශෝධනයට සියලු දෙනාම එරෙහිව සටන් කළ යුතු බවත්, දැනටමත් ඊට එරෙහිව මහා සංඝරත්නය මෙන්ම සිවිල් සංවිධානද, නීතිඥ ප්‍රජාවද සිය විරෝධය පළකොට ඇති බවත්ය. එමෙන්ම විනිසුරුවරුන් සම්බන්ධ ප්‍රශ්නයක් විසඳීම විනිසුරුවරුන්ටම භාරදීමට කටයුතු නොකළ යුතු බවද රනිල් මෙහිදී සඳහන් කර සිටියේය. එමෙන්ම සියලු පාර්ශ්ව ඒකරාශී කරගෙන ආණ්ඩුවේ මෙම ක්‍රියාවලියට එරෙහිව දැවැන්ත විරෝධයක් පැවැත්වීමට පියවර ගතයුතු බවද රනිල් යෝජනා කර සිටියේය. ඉන් අනතුරුව රැස්ව සිටි සියලු පක්ෂ නායකයන් සිය අදහස් පළකිරීමට කටයුතු කළ අතර, නාමල් රැස්වීම අතරමගදී තමන්ට වෙනත් රාජකාරියක් යෙදී ඇති බව සජිත්ට සහ රනිල්ට දැනුම් දෙමින් ඉන් පිටව යැමට පියවර ගත් ආකාරයක් දැකගත හැකි විය. නාමල් වෙනුවට එහිදී සභාව හමුවේ අදහස් දැක්වූයේ පොහොට්ටුවේ මහලේකම් සාගර කාරියවසම්ය.

## දිනේෂ්ට සජිත්ගෙන් ආරාධනා

**මෙහිදී බොහෝ පක්ෂ නායකයන් ආණ්ඩුවට විරෝධය පළකළ යුතු ආකාරය පිළිබඳ විවිධ යෝජනාද සිය කතාවන්වලදී ඉදිරිපත් කළ ආකාරය දැකගත හැකි විය. එහිදී ඇතැමෙකු පෙන්වා දුන්නේ ආරම්භයක් විදියට සියලු පක්ෂ නායකයන්ගේ සහභාගිත්වයෙන් කොළඹදී දැවැන්ත විරෝධතා පෙළපාළියක් පැවැත්විය යුතු යැයි කියාය. තවත් සමහරුන් කියා සිටියේ විපක්ෂයේ සියලු පක්ෂ නියෝජනය වන පරිදි ඒකාබද්ධ රැස්වීම් පාර්ලිමේන්තුවේදීත්, ඉන් පිටතදීත් පැවැත්විය යුතු යැයි කියාය.**

තවත් සමහරුන් පාර්ලිමේන්තුව තුළ දියත් කළ හැකි විරෝධතා පිළිබඳ යෝජනා ඉදිරිපත් කළ ආකාරයක් දැකගත හැකි විය. ඇතැමුන් ඒකාබද්ධ රැස්වීම්, විරෝධතා, පාගමන් පැවැත්විය යුතු බවටද යෝජනා ඉදිරිපත් කළහ. නමුත් ඒ කිසිවක් පිළිබඳ එහිදී අවසන් තීන්දුවක් ගත් ආකාරයක් දැකගන්නට ලැබුණේ නැත.

මේ ආකාරයට පැවැති නිල උත්සවයෙන් පසු ආරාධිත අමුත්තන් වෙනුවෙන් සංවිධාන කොට තිබූ තේපැන් සංග්‍රහයට සහභාගි වන ලෙස සජිත් සියල්ලන්ටම ආරාධනා කර සිටියේය. ඒ අනුව එම අවස්ථාවේදී සියලු දෙනාම ඉතා සැහැල්ලුවෙන් යුතුව එකිනෙකාට සුබපතා ගනිමින් විහිළු තහළු කරගනිමින් සිටි ආකාරයක් දැකගත හැකි විය. මෙහිදී දැකගන්නට ලැබුණු විශේෂම සිදුවීම වූයේ පැමිණ සිටි සියලු දෙනා හමුවටම යමින් සජිත් ඔවුන් සමග අදහස් හුවමාරු කරගැනීමට කටයුතු කිරීමය. වරෙක හිටපු අගමැති දිනේෂ් සමග ඉතා සැහැල්ලුවෙන් යුතුව කතාබහ කරමින් සිටි සජිත් ඔහුට විහිළුවට මෙන් සිනාසෙමින් කියා සිටියේ දිනේෂ්ලා දරන මතවාදය මේ වනවිට සජබය තුළ ක්‍රියාත්මක වන බැවින් ඉදිරියේදී සජබය සමග එක්ව දේශපාලන කටයුතු සිදුකරන ලෙසය.

'දැන් ඔබතුමාට හරියන ප්‍රතිපත්ති තියෙන්නේ අපේ පක්ෂයේ විතරයි. ඔබතුමාලා හැම වෙලාවෙම කතා කළේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ගැන. අපි අනුගමනය කරන්නෙත් ඒ ප්‍රතිපත්තිය. ඒ නිසා අපිත් එක්ක එකතු වෙලා දේශපාලනය කරන්න එන්න...' යනුවෙන් සජිත් සිනාසෙමින් කියද්දී දිනේෂ්ද 'ආ... ඒක හොඳයිනේ...' කියමින් සිනාසෙමින් පිළිතුරු දුන් ආකාරයක් දැකගත හැකි විය. සජිත් ඉන් අනතුරුව චම්පික, විමල්, උදය ආදී පාර්ලිමේන්තුව නියෝජනය නොකරන පක්ෂ නායකයන් සමගද ඉතා සුහදව අදහස් හුවමාරු කරගැනීමට කටයුතු කළ ආකාරය දැකගත හැකි විය. කෙසේ වෙතත් මෙම සාකච්ඡාවේ ඊළඟ අදියර සහ ගත යුතු ක්‍රියාමාර්ග තේරීම පිළිබඳ තීන්දු තීරණ ගැනීම සජිත්ට භාරදීමට සියලු දෙනාම එකඟතාව පළ කළහ.

## ආණ්ඩුව ගත් තීන්දුවේම

**මේ ආකාරයට විපක්ෂය විනිසුරුවරුන්ගේ විශ්‍රාම කාලය දීර්ඝ කිරීමේ යෝජනාවට එරෙහිව එළිපිට කඳවුරු බඳිද්දී ආණ්ඩුව මේ සම්බන්ධයෙන් ගනු ලැබීමට නියමිත තීන්දුව කුමක්ද? අපට ඇති තොරතුරුවලින් කියැවෙන්නේ විපක්ෂය කුමන විරෝධයක් දියත් කළද විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීම සම්බන්ධ වැඩපිළිවෙළ නිශ්චිතව සිදුකොට අවසන් කිරීමට ආණ්ඩුව තීන්දු කොට ඇති බවකි.**

මුලින් මුලින් ආණ්ඩුව විනිසුරුවරුන්ගේ විශ්‍රාම වයස දීර්ඝ කිරීමේ ක්‍රියාවලිය පියවරෙන් පියවර, ක්‍රමක්‍රමයෙන් ඉදිරියට ගෙන යැමට සැලසුම් කර තිබුණද, විපක්ෂය ගෙන ඇති ඇතැම් ක්‍රියාමාර්ග හමුවේ මේ වනවිට ආණ්ඩුව සිටින්නේ මෙම යෝජනාව කඩිනමින් පාර්ලිමේන්තුවට ගෙනැවිත් සම්මත කිරීමේ ස්ථාවරයකය. ඒ අනුව පසුගිය සතියේ පළමු වතාවට ආණ්ඩුව මේ සම්බන්ධයෙන් වූ සංකල්ප පත්‍රිකාවක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පියවර ගත්තේය. ඊට සියලු දෙනාගේම අනුමැතිය හිමිවූ අතර, එය ඉදිරියේදී පුළුල් වශයෙන් සාකච්ඡාවට ලක්කිරීමටද ආණ්ඩුව මේ වනවිට සැලසුම් සකස් කොට තිබේ.

## නීති උපදෙසක් ආවා

**මේ අතරවාරයේ පසුගිය සතිය වනවිට ආණ්ඩුවට මේ සම්බන්ධයෙන්ම තවත් නීති උපදෙසක් ලැබී තිබූ ආකාරයක් දැකගත හැකි විය. එම නීති උපදෙසින් කියැවුණේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ කාලසීමාව සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් කොට තිබුණත්, අගවිනිසුරුවරයාගේ නිල කාලය සම්බන්ධයෙන් එහි නිශ්චිත ප්‍රතිපාදනයක් හෝ සඳහන් කිරීමක් නොමැති බවකි.**

එම නිසා විශ්‍රාම වයස දීර්ඝ කිරීමේදී උපරිමාධිකරණ විනිසුරුවරුන් සම්බන්ධයෙන් සඳහන් කළ යුතු වුවත්, අගවිනිසුරුවරයා සම්බන්ධයෙන් සඳහනක් කිරීම අවශ්‍ය නැති බවත් එම නීති උපදෙස් මගින් ආණ්ඩුවට දැනුම් දී තිබිණි. ඒ අනුව ආණ්ඩුව මේ වනවිට එම නීති උපදෙස පිළිබඳවද සලකා බලමින් සිටින බවක් 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය.

මේ අතරවාරයේ පසුගිය සතියේ දේශපාලන ක්ෂේත්‍රය කලඹාලීමට සමත් වූ තවත් පුවතක් වූයේ හිටිහැටියේම අල්ලස් කොමිසමේ සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරීන් කණ්ඩායමක් ඔස්ට්‍රේලියාව බලා පිටත්ව ගොස් තිබීමය. එහිදී කියැවුණේ ශ්‍රී ලංකන් ගුවන් සමාගමට 2013 වසරේදී යානා 10කින් සමන්විත ගුවන් බළඇණියක් මිලදී ගැනීමේදී ප්‍රංශ ගුවන් සමාගමකින් ඇමෙරිකන් ඩොලර් මිලියන 2ක අල්ලස් මුදලක් ලබාගත් බව කියන ශ්‍රී ලංකන් ගුවන් සේවයේ හිටපු විධායක නිලධාරී කපිල චන්ද්‍රසේන මහතාගේ බිරිය වන ප්‍රියංකා විජේනායක සහ එම නඩුවට අදාළ තුන්වැනි සැකකරු වන චමල් රාජපක්ෂ මහතාගේ පුත් ෂමින්ද්‍ර රාජපක්ෂ යන අය සම්බන්ධයෙන් තොරතුරු සොයා බැලීම සඳහා මෙම නිලධාරීන් ඔස්ට්‍රේලියාව බලා පිටත්ව ගොස් ඇති බවකි.

මෙම සිදුවීම හිටිහැටියේ සිදුවූ එකක් නොව මාස ගණනාවක් තිස්සේ ඔස්ට්‍රේලියානු නීති අංශ සහ එරට පොලිසිය සමග සිදුවූ සාකච්ඡාවක ප්‍රතිඵලයක් ලෙස සිදුවූවකි. එහිදී ප්‍රධාන වශයෙන් කපිල චන්ද්‍රසේනගේ බිරිය සහ ෂමින්ද්‍ර රාජපක්ෂ පිළිබඳ සාකච්ඡාවද තවත් කරුණු කිහිපයක්ම ඔස්ට්‍රේලියානු බලධාරීන් සමග සාකච්ඡා කිරීමට මෙරට විමර්ශන නිලධාරීන් සැලසුම් කොට තිබිණි. ෂමින්ද්‍ර සහ කපිල චන්ද්‍රසේනගේ බිරිය ඔස්ට්‍රේලියා පුරවැසියන් වන අතර මෙරට නීති කෘත්‍යයන් ක්‍රියාත්මක වන අතරවාරයේ ඔවුන් කිසිවකුටත් නොකියා හොර රහසේම ඔස්ට්‍රේලියාවට යැමට පියවර ගෙන තිබිණි. මුදල් විශුද්ධිකරණය සම්බන්ධයෙන් ඔස්ට්‍රේලියාව දැඩිව නීතිය ක්‍රියාත්මක කරන රටක් වීම නිසාත්, ෂමින්ද්‍රට සහ කපිල චන්ද්‍රසේනගේ බිරියට මුදල් විශුද්ධිකරණය යටතේ නඩු පවරා තිබීම නිසාත් මෙම විමර්ශන සඳහා ඔස්ට්‍රේලියානු විමර්ශන අංශවල සහාය ලබාගැනීමට ලංකාවේ විමර්ශකයන්ට පහසු වී තිබිණි.

## නිමල්ගෙනුත් ප්‍රශ්න කරනවා

**එමෙන්ම මෙම අල්ලස් මුදල ප්‍රේෂණය වූයේ යැයි කියන බැංකු ගිණුමක හිමිකරුවකු වූ ඩබ්ලිව්.ඩී. නිමල් පෙරේරාගෙන් ප්‍රකාශයක් ගැනීමද විමර්ශකයන්ගේ මෙම ඔස්ට්‍රේලියානු සංචාරයේ අරමුණක් වී තිබිණි. නිමල් පෙරේරා යනු මෙරට සමාගම් ගණනාවක හිමිකරුවකු වන අතර, පසුගිය කාලයේදී ඔහු ලංකාවට පැමිණ නැවත වතාවක් ඔස්ට්‍රේලියාව බලා යැමට පියවර ගෙන තිබිණි.**

නාමල් රාජපක්ෂ මහතාට සම්බන්ධ ක්‍රිෂ් නඩුව සම්බන්ධයෙන්ද නිමල් පෙරේරාගෙන් ප්‍රශ්න කිරීමට විමර්ශකයන් මීට පෙර කටයුතු කොට තිබිණි. ඒ අනුව මෙම සංචාරයේදී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් සහ අල්ලස් කොමිසමේ නිලධාරීන් නිමල් පෙරේරාද හමුවී ඔහුගෙන්ද ප්‍රකාශ ලබාගැනීමට සැලසුම් කර ඇති බවක් ආරංචිය.

එමෙන්ම නිමල් පෙරේරා ලංකාවේ සිටින කාලයේදී නුවරඑළියේ සහ තවත් ප්‍රදේශයක රෝහල් දෙකක් ඉදිකිරීම සඳහා ඔහුගේ ගිණුම්වලට ලැබී ඇතැයි කියන මුදලක් අවභාවිත කිරීම සම්බන්ධයෙන්ද මෙම නිලධාරීන් ඔහුගෙන් ප්‍රකාශ ලබාගැනීමට සැලසුම් කර ඇතැයිද පැවසේ. එහිදී කොපමණ මුදලක් ලැබුණාද, රෝහල් දෙක ඉදිකිරීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් සහ අදාළ මුදල්වලට සිදුවූයේ කුමක්ද යන්න සොයාබැලීම එහි අරමුණ වී ඇතැයි පැවසේ.

## වත්කම් ලිපිගොනු රැසක්

**මේ සියල්ලට අමතරව තවත් විශේෂ ලිපිගො නු ගණනාවක්ම මෙම විමර්ශන නිලධාරීන් විසින් ඔස්ට්‍රේලියාවට රැගෙන ගොස් ඇති බවක් 'රාජ්‍ය රහස්' තීරයට ආරංචිය. එම ලිපිගොනුවල තිබී ඇත්තේ දේශපාලනඥයන් සම්බන්ධ වූ ගනුදෙනු පමණක් නොව, පැවැති ආණ්ඩුවල ඉහළ නිලතල දැරූ රාජ්‍ය නිලධාරීන් ගණනාවකට සම්බන්ධ තොරතුරුය.**

විශේෂයෙන්ම හිටපු ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරුන් සහ නිලධාරීන් විසින් ඔස්ට්‍රේලියාවෙන් මිලදීගෙන ඇතැයි කියන ඉඩකඩම්, දේපළ මෙන්ම ඔවුන් විසින් ඔස්ට්‍රේලියාවේ පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් රැසක තොරතුරුද මෙම ලිපිගොනු අතර තිබී ඇති බවක් දැනගන්නට තිබේ.

ඊට අමතරව හිටපු ප්‍රබල ජනාධිපතිවරයකුගේ පුත්‍රයකු විසින් මිලදී ගෙන ඇතැයි කියන ඉඩමක් සම්බන්ධයෙන්ද මෙහිදී කිසියම් තොරතුරු සොයාබැලීමක් සිදුකිරීමට නියමිතව ඇති බවක් දැනගන්නට තිබේ.

එමෙන්ම මෙම විමර්ශනවලට අමතරව තවත් ප්‍රබල විමර්ශනයක්ද මේ වනවිට ආණ්ඩුව පැත්තෙන් ආරම්භ වී ඇති බවක් පැවසේ. ඒ, හිටපු ආරක්ෂක අංශ ප්‍රධානියකු විසින් රට මැද්දේ කන්දක් මුදුනක ඉදිකොට ඇතැයි කියන සුපිරි පන්නයේ දැවැන්ත මාලිගාවක් පිළිබඳවය. මෙම හිටපු ආරක්ෂක අංශ ප්‍රධානියා විසින් මෙවැනි ආකාරයේ දැවැන්ත මාලිගාවක් ඉදිකළේ කෙසේද, ඒ සඳහා ඔහු මුදල් උපයා ගත්තේ කුමන ආකාරයටද, ඊට අදාළ ඉඩම ඔහු විසින් ලබාගත්තේ කෙසේද යනාදී තොරතුරු විශාල ප්‍රමාණයක් මේ වනවිටත් විමර්ශන නිලධාරීන් විසින් සොයාගෙන ඇති බවක් දැනගන්නට තිබේ. මෙම හිටපු ආරක්ෂක අංශ ප්‍රධානියාට අමතරව පැවැති ආණ්ඩුවල ඉහළ නිලතල දැරූ රාජ්‍ය නිලධාරීන් රැසක් පසුපසද දැනටමත් විමර්ශන අංශ පන්නමින් සිටින බවක්ද 'රාජ්‍ය රහස්' තීරයට දැනගන්නට තිබේ. ඉදිරි සති කිහිපය ඇතුළත මේ පිළිබඳ තොරතුරු විශාල ප්‍රමාණයක් එළියට පැමිණීමට නියමිත බවක්ද අපට ආරංචිය.

## ඉන්දියාව අවුලෙන්ද?

**වත්මන් මාලිමා ආණ්ඩුව බලයට පත්වූ දින සිට අසල්වැසි ඉන්දියාව සමග පවත්වාගෙන ගියේ ඉතා යහපත් සබඳතාවකි. බලයට පත්වූ වහාම ජනාධිපතිවරයා මුලින්ම හිටපු සියලු ජනාධිපතිවරුන් කළා හා සමානවම ඉන්දියාවේ සංචාරයක යෙදීමට පියවර ගත්තේය. ඉන් අනතුරුව ඉන්දීය අගමැති මෝදිද ලංකාවේ සංචාරය කරනු ලැබීය.**

එම සංචාරයන්වලදී ඇතිකරගත් එකඟතාවන්ට අනුව ඉන්දියාව සහ ලංකාව අතර දැවැන්ත ව්‍යාපෘති කිහිපයක්ම ආරම්භ කිරීමටද එකඟතා ඇතිකරගෙන තිබිණි. ඉන් ඇතැම් ව්‍යාපෘති පසුගිය ආණ්ඩු සමයන්හිදී ආරම්භ කර අතරමග ඇණහිට තිබූ ඒවාය. ඊට හොඳම උදාහරණය සාම්පූර් බලාගාරයය. සාම්පූර් බලාගාරය ආරම්භ කිරීමට යෝජනා වූයේ 2002 වසරේ බලයට පත්වූ රනිල් වික්‍රමසිංහ මහතාගේ කාලවකවානුවේදීය.

ඉන්දියානු සහයෝගිතාවයෙන් සිදුකෙරෙන මෙම බලශක්ති ව්‍යාපෘතියේ ධාරිතාව මෙගාවොට් 120ක් විය. කෙසේ හෝ මුලින් ගල්අඟුරු බලාගාරයක් ලෙස ආරම්භ කිරීමට නියමිත වූ එම ව්‍යාපෘතියට එකල ජනතා විමුක්ති පෙරමුණ ප්‍රධාන සිවිල් සංවිධාන විසින් විරෝධතාව දැක්වූයේය. එහෙත් පසුව වත්මන් රජය යටතේ ජනාධිපති අනුර කුමාර දිසානායක පැවසුවේ 2025 වසරේදී තම රජය යටතේ එම ව්‍යාපෘතියේ කටයුතු නැවත ආරම්භ කෙරී සිදුකෙරෙන බවය. ඒ අනුව ශ්‍රී ලංකා ජනාධිපතිවරයා සහ මෙරට රාජ්‍ය සංචාරයක නිරත වූ ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි අතින් එම ව්‍යාපෘතිය ආරම්භ කෙරිණි. මෙම ව්‍යාපෘතිය අදියර දෙකකින් සමන්විත අතර, මුල් අදියර යටතේ මෙගාවොට් 50ක විදුලි ධාරිතාවක් උත්පාදනය කිරීමට නියමිතය. මෙම සම්පූර්ණ ව්‍යාපෘතිය 2027 වසරේදී නිම කිරීමට නියමිතව තිබුණද මෙහි පළමු අදියරවත් මේ වනවිට නිම කිරීමට නොහැකි වී ඇත. වත්මන් රජයේ බලධාරීන් විසින් ගෙන ඇති යම් තීරණ කිහිපයක් නිසා මේ වනවිටත් අදාළ ව්‍යාපෘතියේ පළමු අදියරවත් නිම කිරීමට නොහැකි වී ඇති බව ඉන්දියාවේ චෝදනාව වී තිබේ.

කෙසේ වෙතත් ආණ්ඩුව මේ සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වමින් කියා ඇත්තේ අදාළ ව්‍යාපෘතියට සමගාමීව ලංකාව සහ ඉන්දියාව අතර එළීමට නියමිත නළවල පළල සම්බන්ධයෙන් යම් ගැටලුවක් මතුව ඇති බවකි.

